**2023.02.09 වන දින වරකාපොල ප්‍රාදේශීය සභාවේ හයවන සැසිවාරයේ**

**පනස් නව වන මහා සභා රැස්වීමේ වාර්තාව.**

**සහභාගිවූවෝ**

| | |
|---|---|
| 01. එන්. සරත් සුමනසූරිය මැතිතුමා | ගරු සභාපති |
| 02.ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා | ගරු උප සභාපති |
| 03.ආර්.අර්.එම්.පී.රාජකරුණා මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 04.එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 05.එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 06.එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 07.එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 08.එම්.ආර්.ධර්මකීර්ති ආරියරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 09.කේ.ඒ.එස්.සී.ගුණතිලක මැතිනිය | ගරු මන්ත්‍රී |
| 10.කේ.ඒ.නිරෝෂණී පෙරේරා මැතිනිය | ගරු මන්ත්‍රී |
| 11.ඒ.පී.ධම්මික සුමනසිරි මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 12.එම්.පී.එන්.වර්ණකුල මැතිනිය | ගරු මන්ත්‍රී |
| 13.එච්.ආර්.දයාරත්න වීරසූරිය මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 14.අයි.පී.අජිත් ගුණපාල මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 15.පී.ජී.මංජු ශ්‍රී ජයශාන්ත මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 16.එම්.පී.සමීර ප්‍රියසාද් මුතුගල මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 17.එන්.අකිල ප්‍රසාද් ජයරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 18.එම්.පී.සමන්මාලා මැතිනිය | ගරු මන්ත්‍රී |
| 19.ඩබ්.ඒ.මංජුල සරත් කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 20.ඒ.පී.රුවනි තරංගා විමර්ශනී මැතිනිය | ගරු මන්ත්‍රී |
| 21.එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 22.ඩී.ටී.කරුණාදාස ලෙනගල මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 23.පී.සරත් කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 24.එච් සේනක ප්‍රියන්ත කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 25.ඩී.ජයසිංහ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 26.කේ.රංජිත් කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 27.එස්.ආර්.කේ.ලොකු ගලප්පත්ති මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 28.ජී.සනත් සේමසිරි වීරරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 29.එස්.ඒ.ඉනෝකා ශ්‍යාමලී සමරවීර මැතිනිය | ගරු මන්ත්‍රී |
| 30.එල්.ආර්.ප්‍රියදර්ශනී අබේරත්න මැතිනිය | ගරු මන්ත්‍රී |
| 31.එල්.රංගනී ඉන්දු කුමාරි බණ්ඩාර මැතිනිය | ගරු මන්ත්‍රී |
| 32.ජී.ආර්.රේණුකා ගම්ලත් මැතිනිය | ගරු මන්ත්‍රී |
| 33.එච්.එම්.එන්.ජී.යූ.ගයානි හේරත් මැතිනිය | ගරු මන්ත්‍රී |
| 34.ආර්.ඩී.චන්ද්‍රා සෝමලතා මැතිනිය | ගරු මන්ත්‍රී |
| 35.කේ.ටී.ආනන්ද කරුණානායක මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 36.ජී.එල්.විජිත ගුණවර්ධන මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 37.ඩබ්.බී.ඩබ්.එම්.ආර්.අයි.ඩී.අළුවිහාරේ මැතිතුමා | ගරු මන්ත්‍රී |

**සහභාගී වූ නිලධාරීන්**

| | |
|---|---|
| 01. ඩී.එම්.එම්.පී. දුනුසිංහ මිය | ලේකම් |
| 02. ඊ.එස්.අයි.වී. රොමේසන් මිය | විෂය නිළධාරී |

**<u>අ- 01</u>**
**<u>2023.01.05 වන දින මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.</u>**

**<u>සභාගත කිරීම.</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
**2023.01.05** වන දින මහා සභා රැස්වීම් වාර්තාව සභාගත කරනවා. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න අවස්ථාව.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා</u>**
**2023.01.05** වන දින මහා සභා වාර්තාවේ සංශෝධන නොමැති නම් සභා සම්මත කිරීමට අවස්ථාව.

**<u>ගරු මන්ත්‍රී එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා</u>**
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

***(ඒ අනුව 2023.01.05 වන දින මහා සභා රැස්වීම් වාර්තාව 2023.02.09 වන දින තීරණ අංක අ-01 යටතේ ඒකමතිකව සභා සම්මත විය)***

(ආ) ගරු සභාපතිතුමා විසින් කරන විශේෂ නිවේදන. –

01.

2023 වර්ෂය සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ ඔබ වෙත ලබා දී ඇති බැවින් ඒවා සම්පූර්ණ කර ලේකම්තුමිය වෙත භාර දීමට කටයුතු කරන්න. තවද 2022 වර්ෂය සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ ලබා නොදුන් ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා කඩිනමින් ඒවා ලේකම්තුමිය වෙත භාර දීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ඇ)** ප්‍රාදේශීය සභාව අමතා එවන ලද පෙත්සම් හා සංදේශ සභාගත කිරීම -නැත

**(ඈ)** කල් දී ඇති ප්‍රශ්න - නැත

**(ඉ)** කල් දී ඇති යෝජනා

**<u>ඉ - 01</u>**
**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**
වරකාපොල ප්‍රාදේශීය සභාව සතු අලව්වත්ත සණසපුර පර්චස් 40කින් යුතු ඉඩම 2023 වසර සඳහා බදු දීම වෙනුවෙන් ලංසු කැඳවා 2023.01.27 දින ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකරන ලදී. ඒ වෙනුවෙන් ඉදිරිපත්ව තිබූ ලංසුකරුවන් සහ මිල ගණන් පහත දැක්වේ.

| අනු අංකය | ලංසුකරුගේ නම හා ලිපිනය | ලංසු මුදල |
|---|---|---|
| 01 | බී.ඒ.කුමාරදාස මයා, නො 04, අශෝකාරාම පාර, අලව්වත්ත, අලව්ව | රු.12500.00 |
| 02 | ආර්.පී.ඩී.එස්.යූ.කුමාර මයා, නො 13, අශෝකාරාම පාර, අලව්වත්ත, අලව්ව. | රු.13500.00 |

ඒ අනුව ඉහත ලංසුකරුවන් අතරින් රු.13500.00ක වැඩි මිලක් ඉදිරිපත් කර ඇති ආර්.පී.ඩී.එස්.යූ.කුමාර යන අයට වාර්ෂික බදු පදනම යටතේ ඉහත ඉඩම ලබා දීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

අපි ළඟ තිබෙන පොදු ඉඩම් සහ සුසාන භූමි, කොරටු වගාව සඳහා බදු දෙන්නටත්, ආදායම් ලබා දෙන ඉඩම් වලින් ආදායම් ලබා ගන්නටත් තීන්දු කලා. ගලප්පත්ති මන්ත්‍රීතුමා, විපක්ෂනායකතුමා, ඉලංගරත්න මන්ත්‍රීතුමා යන අය විසින් දිගින් දිගටම මේ පිළිබඳව පෙන්වා දුන්නා. කාලයක් තිස්සේ මේ ඉඩම් ටික නිරවුල් කර ගන්නට කුමාර මන්ත්‍රීතුමා දැඩි මහන්සියක් ගත්තා. ඒවා අපි භුක්ති නොවිදීම නිසා පිටස්තර පුද්ගලයන් විසින් ඒවා අල්ලා ගෙන.අලව්වත්තේ එකට කුමාර මන්ත්‍රීතුමා ගොඩක් මහන්සි වුණා ඒ පිළිබඳව ස්තූතිවන්ත වෙනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 01 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 02</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

වරකාපොල සතිපොල භූමියේ කඩ කාමර අංක 02 මාළු 01 කඩය දෙවන වර ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් වුවත් ගිවිසුම්ගත වීමට ඉදිරිපත් නොවීම නිසා ප.පා.කො 03/2020 චක්‍ර ලේඛ ප්‍රකාරව 10% ක් අඩුකර ප්‍රාදේශීයව දැණුවත් කර 2023.03.15 දින සිට 2023.12.31 දක්වා තෙවන වර ටෙන්ඩර් කිරීමට මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කඩ කාමරයේ නම | ආකෘති පත්‍ර ගාස්තුව | ටෙන්ඩර් ඇප මුදල | අවම ලංසුව (රු) |
|---|---|---|---|---|
| 01 | වරකාපොල සතිපොල භූමියේ කඩ කාමර අංක 02 මාළු 01 කඩය | 1500.00 | 3000.00 | 255386.06 |

**<u>ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

මේ මාළු කඩය විශාල මුදලකට ඉල්ලුම් කරලා තිබුණා, එක ටෙන්ඩර් කරුවෙක්. ඒ නිසා ඒ මුදලට පහළින් අපට දැන් ටෙන්ඩර් දමන්නට බැහැ. මේ අවුරුද්දේ මුදලට 10%ක් එකතු කරලා තමයි ඊළඟ අවුරුද්දේ අපි ටෙන්ඩර් කරන්නේ. මේ වගේ ලොකු මුදලකට ගන්නේ නැහැ. ඒ නිසා 10%ක අඩු කරලා ටෙන්ඩර් කරන්න කියලා තීන්දුවක් ගන්න ඕනේ.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 02 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 03**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

2023 වර්ෂය සඳහා තෙවන වර ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් නොවූ මස් කඩ,මාළු ලැලි, කඩ කාමර, පොදු වැසිකිළි,හෝරා ස්ථම්භ හා වාරියගොඩ සතිපොල බදු දීම සඳහා වූ සිව්වන වර ටෙන්ඩර් විවෘත කිරීම හා ගිවිසුම් ගත වීමට ඉදිරිපත් නොවූ කඩ කාමර මාළු ලැලි සඳහා දෙවන වර ටෙන්ඩර් විවෘත කිරීම 2023.01.27 වන දින පෙ.ව 10.15 ට වරකාපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී සිදු කරන ලදී. ඒ සඳහා වූ පහත සඳහන් ටෙන්ඩර් මණ්ඩල නිර්දේශ පිළිගැනීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

**01.**අඟුරුවැල්ල පාර තල්ලියැද්ද වරිපනම් අංක 409 ඇස්බැස්ටෝස් සෙවිළි ට්‍රාන්ස්පෝමරය දරන ගොඩනැගිල්ල යන කඩ කාමරය සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත් 01 ක් ලැබී තිබුණි. මෙහි අවම ලංසු මුදල රු. 17758.12 කි.

| නම | ලිපිනය | ලංසු මුදල (රු) |
|---|---|---|
| වයි.පී.එස්.ලක්ෂාන් මයා | මායින්නොළුව, දොරවක | 20000.00 |

ඒ අනුව ඉදිරිපත් කර තිබූ එකම ටෙන්ඩරය වුවද අවම ලංසුවට වඩා වැඩි බැවින් එම ටෙන්ඩරය පිළිගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
එමෙන්ම ගිවිසුම්ගත වීමට නොපැමිණීම නිසා දෙවන වර ටෙන්ඩර් කරනු ලැබූ කඩ කාමර හා මාළු ලැලි සඳහා දෙවන වරටද ටෙන්ඩර් ඉල්ලුම්පත් නොලැබුණ හෙයින් වාරියගොඩ පාලම අසළ මාළු ලැල්ල ප.පා.කො. 03/2020 චක්‍ර ලේඛ ප්‍රකාරව 10% ක් අඩුකර ප්‍රාදේශීයව දැණුවත් කර තෙවන වර ටෙන්ඩර් කිරීමට ටෙන්ඩර් මණ්ඩලය යෝජනා කරන ලදී.

**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

කලින් මායින්නොළුව ට්‍රාන්ස්පෝමරය දරන ගොඩනැගිල්ල ටෙන්ඩර් දැමුවායින් පස්සේ ටෙන්ඩර්කරු විදුලි බිලක් ගෙවන්න තිබුණා. ඒ විදුලි බිල මේ පුද්ගලයා ගෙවන්නෙත් නැහැ. එන්න එන්න දඩයකුත් එකතු වුනා. ඒ නිසා මම කිව්වා මේක කොහොම හරි ටෙන්ඩර් දමලා කරන්න කියලා.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 03 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 04**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

වරකාපොල සතිපොල භූමියේ ඉදිකර ඇති නව කඩ කාමර ගොඩනැගිල්ලේ ඉහල මාලයේ අංක 09 දරණ කඩ කාමරය තිස් අවුරුදු දීර්ඝ කාලීන බදු පදනම යටතේ 2022.11.28 දින පැවති ටෙන්ඩර් විවෘත කිරීමේ කමිටුවේදී ටෙන්ඩර් කරන ලදී. මෙම කඩ කාමරය සඳහා එක් ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රයක් පමණක් ඉදිරිපත් කර තිබුණද අවම ලංසු මුදලට වඩා වැඩි මුදලකට ටෙන්ඩර් මුදල සඳහන් කර තිබූ බැවින් අංක 131/1, නුවර පාර, වේවැල්දෙණිය යන ලිපිනයේ පදිංචි එම්.ආර්. එම්. ඉෆ්තිකාර් මහතාට ටෙන්ඩරය හිමි විය. එනමුදු එම්.ආර්. එම්. ඉෆ්තිකාර් මහතා ගිවිසුම් ගත වීමට නොපැමිණි හෙයින් එම කඩ කාමරය දීර්ඝ කාලීන බදු පදනම යටතේ නැවත ටෙන්ඩර් කිරීමටත් ඊට අදාළව පුවත්පත් දැන්වීම් පළ කර ගෙවීම් කටයුතු සිදු කිරීමටත් වමහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා.**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

ඉහත පුද්ගලයා ටෙන්ඩරය ගත්තා. නමුත් මුදල් ගෙවලා ගත්තේ නැහැ. ආපසු සැරයක් ටෙන්ඩර් කරන්න පත්තර දැන්වීම දමන්නට ඕනේ.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 04 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සහා සම්මත විය.***

**<u>ඉ - 05</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

වරකාපොල සතිපොල භූමියේ අලුතින් ඉදිකල කඩ කාමර ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ කඩ කාමර 07 2023 වර්ෂයේ සිට අවුරුද 30 කට දීර්ඝ කාලීන බදු ලබා දීම සඳහා ටෙන්ඩර් කිරීම සිදුකරන ලදී.
ඒ අනුව ටෙන්ඩර් පිළිගත් කඩ කාමර සඳහා අදාළ මුදල් අය කර ගිවිසුම් ගත විය යුතු බැවින් එකවර ගෙවිය යුතු අවම ලංසු මුදල හා ගිවිසුම් තැම්පත් මුදල් අය කර බදු ගිවිසුම් අත්සන් කරන ලදී.
එසේ වුවත් එකී කඩ කාමර සඳහා විදුලි සැපයුම් ලබා ගැනීමට විදුලි බල මණ්ඩලයෙන් ටෙන්ඩර් කිරීම් සිදු කිරීමට පෙර සිටම ඉල්ලුම් කර ඇතත් විදුලි මීටර හිඟයක් පවතින බැවින් විදුලිය ලබා දීම මේ වන තෙක් ප්‍රමාද වී ඇත. විදුලි බලය ලබා නොදීම නිසා පැන නැගී ඇති මෙම ගැටළුව පිළිබඳව දන්වා මෙම කඩ කාමර සඳහා ඉක්මනින් විදුලිය ලබා දෙන ලෙස විදුලි බල මණ්ඩලය වෙත ලිඛිතව මෙන්ම දුරකථන පණිවිඩ මඟින් වාචිකවද දැණුම් දී ඇත.

එබැවින් විදුලි පහසුකම් ලබා දෙන තෙක් එකී කඩ කාමර ව්‍යාපාරික කටයුතු සඳහා යොදවා ගත නොහැකි බැවින් අදාල පුද්ගලයන්ට කඩ කාමර යතුරු භාර දිය නොහැකි අතර එම කඩ කාමර සඳහා විදුලිය ලබා දෙන තෙක් මාසික කුලී අය නොකිරීමටත් විදුලිය ලබා දුන් පසු කඩ කාමර භාරදී එතැන් සිට මාසික ගාස්තු අය කිරීම සුදුසු බවටත් එය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යැවීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

ටෙන්ඩර් කළා, නීත්‍යාණුකූලව අපි මුදල් ගත්තා. අපි විදුලි බල මණ්ඩලයෙන් විදුලිය ඉල්ලා තිබුණා. නමුත් විදුලි මීටර් හිඟකම නිසා විදුලි බල මණ්ඩලයෙන් විදුලිය දීම ප්‍රමාද වුනා .මම දිගින් දිගටම කතා කලා. විදුලි මීටර් ටික ගන්න කටයුතු කරමින් ඉන්නවා. නමුත් අපිට මුල් ටිකේ මුදල් අය කර ගන්න බැහැනේ. ඒ නිසා ආදායමක් අහිමි කර ගන්න බැහැ අපිට. විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියක් නැතුව ආදායමක් අහිමි කර ගන්න බැහැ අපට. ඒ නිසා ආණ්ඩුකාර අනුමැතියට යවන්නට තමයි මේ යෝජනාව දැම්මේ. මේ වේලාවේ මේක සාමාන්‍ය තත්වය.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.</u>**

අපි ටෙන්ඩර් පටිපාටිය යන විට විදුලිය ලබා දෙනවා කියන පදනමේ තමයි අපි ඉදලා තිබෙන්නේ. විදුලිය ලබා දීලා තමයි අපි ටෙන්ඩර් කරන්න ඕනේ. එම පුද්ගලයාට විදුලිය ලබා දෙනකම් මාසයක් හෝ දෙකක් හෝ පසුව තමයි ගෙවන්නම් කියලා කියන්නේ. විදුලිය ලබා ගත්තායින් පසුව අපි එය අංග සම්පූර්ණ කළ යුතුයි.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

විපක්ෂනායකතුමා ප්‍රශ්නය තිබෙන්නේ සත්‍ය වශයෙන්ම රටේ පවතින තත්වය තමයි අපි විදුලිය අයදුම් කල පසු මාසයක් ඇතුලත අපට විදුලිය දෙනවා. විෂය විසින් ඒ අයදුම් පත්‍ර ඉදිරිපත් කළා. එතකොට අපට මාසයක්

යන විට දෙනවා නේ. මම කියන්නේ ප්‍රායෝගික තත්වය.පසු කාලීනව දෙන්න යන කොට විදුලි මීටර් වල හිඟයක් ආවා.රටේ පවතින තත්වය වෙනස් කර ගන්න බැහැනේ. පත්තර දැන්වීම දමලා. ටෙන්ඩර කඩපු විට අපි ඒ මුදල් බඳවා ගන්නට ඕනේ. මේ තත්වය ගරු ආණ්ඩුකාරතුමාට මම පැහැදිලි කරලා කිව්වා. එතුමා කිව්වා මහ සභා අනුමැතියක් එවන්න කියලා. එතුමා අනුමැතිය දෙන්නම් කිව්වා.

<u>**ගරු මන්ත්‍රී එස් ආර් කේ ලොකුගලප්පත්ති මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, ඔබතුමාට පුළුවන් නම් විදුලි ඉංජිනේරුවරයාට කතා කරන්න. පරණ මීටර් තිබෙනවා. පරණ මීටර් කුරුණෑගලට ගිහිල්ලා හදා ගෙන එන්න නම් පුළුවන්. අපේ කවුරු හෝ නියෝජිතයෙකු යැව්වොත්.

<u>**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**</u>

ඔබතුමා පොඩ්ඩක් මැදිහත් වෙන්නකෝ.දැන් ඇවිත් තියනවා කියනවා. නමුත් පසුගිය ටිකේ ප්‍රශ්නයක් තිබෙනවානේ.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 05 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

<u>**ඉ - 06**</u>

<u>**මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**</u>

**2023.01.17 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ පහත සඳහන් නිර්දේශයන් අනුමත කිරීමට මහ සභාවට යෝජනා කරමි.**

01. ගිණුම් අංක 054-1-001-1-7380404 හි නිකුත් කල නමුත් මාරු නොවූ පහත සඳහන් චෙක්පත් මාස 6 ක් ඉක්මවා ගොස් ඇති බැවින් ,මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව ආදායමට ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

| අනු අංකය | දිනය | චෙක්පත් අංකය | ආදායකයාගේ නම | චෙක්පතෙහි වටිනාකම |
|---|---|---|---|---|
| 01 | 2022.02.15 | 027641 | එස් නානායක්කාර | 3,000.00 |
| 02 | 2022.04.07 | 036036 | ඒ.ඒ විපුලසිරි | 29,975.00 |
| 03 | 2022.04.20 | 036075 | ඩී.පී සුනිල් ප්‍රේමතිලක | 6,000.00 |

**02.**සබරගමු පළාතේ පලාත් පාලන ආයතන සඳහා ක්‍රියාත්මක ජී.අයි.එස් තාක්ෂණය භාවිත කර මාර්ග සිතියම් සකස් කිරීමේ වැඩසටහනෙහි දෙවන අදියර, ගලිගමුව ප්‍රාදේශීය සභාවේ සංවිධානයෙන් හා අප පළාත් පාලන ආයතනවල දායකත්වය යටතේ (කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන වල) 2022.12.08,09,10 දිනවලදී කෑගල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදී පැවැත් විය. එම වැඩසටහන සඳහා වියදම් මුදලින් අප සභාවට අයත් වියදම වන රුපියල් 12,855.00 ක මුදල ගෙවීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**03.**2022.11.03 වන දින මහසභා තීරණ අංක ඉ 26 යටතේ 1'*4' ප්‍රමාණයේ බෝක්කු බට 49 ක් හා 1.5'*4' ප්‍රමාණයේ බෝක්කු බට 33 මිලදී ගැනීමේ අනුමැතිය යටතේ රු:497,400.00 ක මුදල අඹගල හාඩ්වෙයාර් වෙතට ගබඩාවට ලැබුණ පසු ගෙවීම් කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**04.**ගලපිටමඩ පාර තුන්තොට වරිපනම් අංක 64/4 උළු සහ ඇස්බැස්ටස් සෙවිලි නිවස යන වරිපනම් දේපල කේ.පී සෝමාවතී යන නමින් ලේඛණගතව ඇත. ඇය රෝගාතුර බවත් රැකියාවක් කර ගැනීමට නොහැකිව දරිද්‍රතාවයෙන් පෙලෙන බවත් එමනිසා වරිපනම් ගෙවීමට නොහැකි බවත් දන්වා ලිඛිතව කල ඉල්ලීම

ආදායම් පරීක්ෂක මහතා විසින් පරීක්ෂාකර වාර්තා කොට ඇති අතර අදාල වසම භාර ග්‍රාම නිලධාරී විසින්ද අඩු ආදායම් සමෘද්ධි ලාභී පවුලක් බව සහතික කොට ඇත .

ඒ අනුව ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය යටතේ හිඟ වරිපනම් බදු මුදල වන 4,418.73 ක මුදල කපා හැරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී.
වරිපනම් සම්බන්ධයෙන් අදාල විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | වරිපනම් ප්‍රදේශය | වරිපනම් අංකය | නම | දේපල විස්තර | 182 වගන්තිය අනුව 2022.12.31 දක්වා කපා හැරිය යුතු හිඟ |
|---|---|---|---|---|---|
| 01 | ගලපිටමඩ පාර තුන්තොට | 64/4 | කේ.පී සෝමාවතී | උළු හා ඇස්බැස්ටෝස් සෙවිලි නිවස | 4418.73 |

<u>**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.
<u>**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**</u>
ගරු මන්ත්‍රීවරුනි, මෙහි සඳහන් 04 වන නිර්දේශය වන
ගලපිටමඩ පාර තුන්තොට වරිපනම් අංක 64/4 උළු සහ ඇස්බැස්ටස් සෙවිලි නිවස යන වරිපනම් දේපල කේ.පී සෝමාවතී යන නමින් ලේඛණගතව ඇත. ඇය රෝගාතුර බවත් රැකියාවක් කර ගැනීමට නොහැකිව දරිද්‍රතාවයෙන් පෙලෙන බවත් එමනිසා වරිපනම් ගෙවීමට නොහැකි බවත් දන්වා ලිඛිතව කල ඉල්ලීම ආදායම් පරීක්ෂක මහතා විසින් පරීක්ෂාකර වාර්තා කොට ඇති අතර අදාල වසම භාර ග්‍රාම නිලධාරී විසින්ද අඩු ආදායම් සමෘද්ධි ලාභී පවුලක් බව සහතික කොට ඇත .

ඒ අනුව ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය යටතේ හිඟ වරිපනම් බදු මුදල වන 4,418.73 ක මුදල කපා හැරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී.
වරිපනම් සම්බන්ධයෙන් අදාල විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | වරිපනම් ප්‍රදේශය | වරිපනම් අංකය | නම | දේපල විස්තර | 182 වගන්තිය අනුව 2022.12.31 දක්වා කපා හැරිය යුතු හිඟ |
|---|---|---|---|---|---|
| 01 | ගලපිටමඩ පාර තුන්තොට | 64/4 | කේ.පී සෝමාවතී | උළු හා ඇස්බැස්ටෝස් සෙවිලි නිවස | 4418.73 |

**යන්න**
ගලපිටමඩ පාර තුන්තොට වරිපනම් අංක 64/4 උළු සහ ඇස්බැස්ටස් සෙවිලි නිවස යන වරිපනම් දේපල කේ.පී සෝමාවතී යන නමින් ලේඛණගතව ඇත. ඇය රෝගාතුර බවත් රැකියාවක් කර ගැනීමට නොහැකිව දරිද්‍රතාවයෙන් පෙලෙන බවත් එම නිසා වරිපනම් ගෙවීමට නොහැකි බවත් දන්වා ලිඛිතව කල ඉල්ලීම ආදායම් පරීක්ෂක මහතා විසින් පරීක්ෂාකර වාර්තා කොට ඇති අතර අදාල වසම භාර ග්‍රාම නිලධාරී විසින්ද අඩු ආදායම් සමෘද්ධි ලාභී පවුලක් බව සහතික කොට ඇත .
වරිපනම් සම්බන්ධයෙන් අදාල විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | වරිපනම් ප්‍රදේශය | වරිපනම් අංකය | නම | දේපල විස්තර | 182 වගන්තිය අනුව 2022.12.31 දක්වා කපා හැරිය යුතු හිඟ |
|---|---|---|---|---|---|
| 01 | ගලපිටමඩ පාර තුන්තොට | 64/4 | කේ.පී සෝමාවතී | උළු හා ඇස්බැස්ටෝස් සෙවිලි නිවස | 4418.73 |

ඒ අනුව ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය යටතේ හිඟ වරිපනම් බදු මුදල වන 4,418.73 ක මුදල කපා හැරීම සුදුසු බවට මහා සභා සම්මතයක් ලබා ගෙන විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී ලෙස සංශෝධනය විය යුතුයි.

<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා</u>

ඒ යෝජනාව සංශෝධන වලට යටත්ව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 06 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.***

<u>**ඉ - 07**</u>

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව</u>

වරකාපොල ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් කඩ කාමර 2 වර්ෂ 10කට දීර්ඝ කාලීනව බදු ලබා දීම සඳහා නව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. වාරියගොඩ සතිපොළ කඩ කාමරය
2. ළමා උද්‍යානය අසල ආපන ශාලාව

<u>ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>

වාරියගොඩ පොල ගත්ත අය විසින් මේ කඩ කාමරය ඉදි කරලා තිබුණා. ඒක කඩා ඉවත් කර ගෙන යන්න හැදුවා. මම කිව්වා කඩය කඩා ඉවත් කරලා ගෙන යන්න දෙන්න බැහැ කියලා. සති පොල ටෙන්ඩර් කරලා ගත්තේ නැති නම් ඒක අපේ. අපි පොළ දුන්නට එයාලට කඩ ගහන්න කියලා කිව්වේ නැහැනේ. ඒ නිසා මම කිව්වා ඒ කඩේ මම ටෙන්ඩර් දමනවා කියලා. අපි සතු වත්කමක්නේ.ඒ මනුස්සයා පොලට මුදල් ගෙවනවා පොළට මිනිස්සු එන්නේ නැහැ පොලෙන් පාඩුයි. ඒ මනුස්සයා ඒක පියවා ගන්න මොකක් හරි දෙයක් කලා . ඒකට මට බාධා කරන්න බැහැ. දැන් එයා පොල ගත්තේ නැහැ. පොල ගත්තේ නැති නම් ඔයා අයින් වෙන්න. කිව්වා කඩ කාමර කඩා ගෙන යන්න දෙන්න බැහැ. දැන් ඒ වත්කම අපේ. කුමාර මන්ත්‍රීතුමයි මමයි ගියා සණසපුර ඉඩමට.මිනිස්සු ගස් හදලා.තේක්ක කොස් එහෙම තිබෙනවා.ඒ අය කියනවා ඒවා එයාලට අයිතියි කියලා. මම කිව්වා මගේ ඉඩම් වල කවුද ඔයාලට ගස් හදන්න කිව්වේ කියලා. ළමා උද්‍යානය අසල ආපන ශාලාව කියලා කියන්නේ ඒකත් අපි හදපු එකක් නෙවෙයි. මට සභා සල්ලි වියදම් කරන්න නැහැ.ළමා උද්‍යානයට එන මිනිස්සුන්ට කන්න බොන්න නැහැනේ. මම සභා සල්ලි වියදම් කරන්නේ නැතුව එක එක සම්පත්දායකයෝ එකතු කරගෙන කඩ කාමරයක් ඒකේ හැදුවා.

<u>ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.</u>

ගරු සභාපතිතුමා ව්‍යාපාරිකයින් හොයා ගත්ත පලියට අපි සතු තිබෙන දේපළ ටික එහෙම දෙන එක වැරදියි.

ඝෝෂාකාරී..................................

<u>**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**</u>
අපි මේක අයින් කරමු. දැන් ඔබතුමාගේ අදහස් දැක්වීමට මම ගරු කරනවා. සභාපතිවරයා ලෙස හේතු දන්වපු විට ලෙහෙසියි නේ ඔබතුමාට කතා කරන්න. මම සභාවේ ආදායම් වැඩි කරන්න ඕනේ. ලක්ෂ පනස් හතක් ප්‍රතිපූර්ණය නොවන වැය මාසිකව. මම බඳවා ගත්ත අය නෙවෙයි හිටපු සභාපතිතුමා අනියම් හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත්ත අය සේවයෙන් අයින් කරන්න බැහැ. ඒ අයට පඩි ගෙවන්න ඕනේ. ස්ථිර සේවකයින්ගේ අතිකාල ගෙවන්න ඕනේ. ඉන්ධන , වාහන නඩත්තුව ,විදුලි බිල, දුරකතන බිල, ජල බිල, මේ ඔක්කොම දළ වශයෙන් ගත්ත විට ලක්ෂ පනස් හතක් පමණ මාසිකව ප්‍රතිපූර්ණ නොවන වැය. මට ඒවා ආණ්ඩුවෙන් හම්බ වෙන්නේම නැහැ. ඔබතුමන්ලාගේ දුරකතන දීමනාව, ඉන්ධන දීමනාව ගෙවන්න ඕනේ. මේවාට මම සල්ලි හොයන්න ඕනේ. අපි ඒ නිසා එක එක උපක්‍රම යොදනවා .තමුන්නාන්සේලා කියනවා නම් මේ කඩ කාමරය හදන්න ගිය සභා වාරයේ අනුමැතිය ගත්තේ නැතිනම්. නීත්‍යානුකූලව මේ ටෙන්ඩර් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මම ඒ යෝජනාව ඉල්ලා අස්කර ගන්නවා.

<u>**ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.**</u>
ගරු සභාපතිතුමා මේකේ හරි වැරදි බලලා මේකේ ආදායම් වැඩි කරන්නට ඕනේ. නැතිනම් මේක පවත්වා ගෙන යන්නට බැහැ. අප යම් කිසි ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කරලා අපි ආදායමක් ලබා ගන්නට ඕනේ. සභා දේපළ වල මට හිතෙන තැන හදන්න බැහැ. අපට නීතිමය රාමුවක් තිබෙනවා. මම මෙතනදී කියන්නේ උදාහරණයක් ලෙස කියන්නම් වරකාපොල ක්‍රීඩා පිට්ටනිය ගත්තේ සභාවේ ලක්ෂ හතක් වියදම් කරලා. නාගරික සංවර්ධන අධිකාරිය ඉඩම් හුවමාරු කර ගැනීමේදී අපේ සම්පත් ටික අපි දීලා අද අපි දුක් විදිනවා. අපේ සභාවෙන් ලක්ෂ හතක් දුන්නේ ඒකට. අපි හැමෝටම එතනින් ගහ ගන්න මෙතනින් ගහ ගනින් කියන එක නොවෙයි මම කියන්නේ. සභාවට ආදායමක් වගේම මේවාට යම් කිසි ක්‍රියා පටිපාටියක් තිබෙනවා.මේක අවුරුද්දක් ගානේ 10%ක් වැඩි වෙන්නටත් ඕනේ.

**(*ගරු මන්ත්‍රී එල්.ආර්.ප්‍රියදර්ශණී අබේරත්න මැතිනිය පෙ.ව 10.38 පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.*)**

<u>**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**</u>
විපක්ෂ නායකතුමා මට විනාඩියක් දෙන්න.මේක වැරදියි. මේක අවුරුද්දකට දමන්න ඕනේ. මම කලබලේ මේක කියෙව්වට ඇත්තටම මේක වැරදියි. මේක සංශෝධනය කරලා දෙන්නකෝ අවුරුද්දකට කියලා. ඔබතුමා උදේ ඉදන් රෑ වෙනකම්ම මේකේ ඉන්නේ. ඔයාට මේක කියන්න තිබුණනේ.

<u>**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**</u>
මෙහි සඳහන් වරකාපොල ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් කඩ කාමර 2 වර්ෂ 10කට දීර්ඝ කාලීනව බදු ලබා දීම සඳහා නව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි යන්න වරකාපොල ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් කඩ කාමර 2 වර්ෂයකට බදු ලබා දීම සඳහා නව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි ලෙස සංශෝධනය විය යුතුයි.

<u>**ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා**</u>
ඒ යෝජනාව සංශෝධන වලට යටත්ව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 07 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 08**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**

මාහේන ආදාහනාගාරයේ ඇති ජෙනරේටරයේ විදුලි පරිපථ මීයන් විසින් හානි කිරීම හේතුවෙන් ජෙනරේටරයේ නියෝජිත ආයතනය වූ වින්සි ඉංජිනියරින් ආයතනය විසින් කරන ලද පරීක්ෂාවට අනුව එම විදුලි පරිපථ අලුත්වැඩියා කිරීමක් සිදු කල යුතු බව දන්වා ඇති අතර ඊට අදාලව වූ ඇස්තමේන්තුව අප වෙත එවා ඇත.

02.ඒ අනුව එම විදුලි පරිපථය අලුත්වැඩියා කිරීම සඳහා වූ රු.258750.00ක වැය ඇස්තමේන්තුව පිළිගැනීමටත්, ජෙනරේටරයේ සේවා ආයතනය වන බැවින් කාර්ය අවසන් වූ කාර්මික නිළධාරී වාර්තාවකින් පසු මුදල් ගෙවීමටත් සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

අපි අලුතින් ගෙන ආ ජෙනරේටරයේ දැල් ගහ ගන්න තිබුණා. මට තේරෙන්නේ නැහැ, වැඩ කරන්නේ නැහැ කියලා කිව්වා. බැටරිය පිච්චිලා හොයලා බලපුවාම මීයෝ කාලා තිබෙනවා එක තැනක. වැඩි විදුලි ධාරිතාවයත් ඇවිල්ලා බෝඩ් එක පිච්චිලා. නියෝජිත ආයතනයට කීව විට ඒක ඇස්තමේන්තුවත් හදලා සකස් කරලා දෙනවා. ඒක හදන්න තමයි මේ යෝජනාව දැම්මේ.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 08 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 09**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව**

වරකාපොල ඔරලෝසු කණුවට යාබඳ වරිපනම් අංක 148 බී දරණ කඩ කාමරය දීර්ඝ කාලීනව බදු ලබා දීම සඳහා අදාල තක්සේරු වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර ගැනීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි මේ කියන්නේ ඔර්ලෝසු කණුව ළඟ එකනේ. පසුගිය කාල සීමාවේ මට මතකයි, මේක ටෙන්ඩර් කලා. අපි මේක යම් කිසි කොන්දේසියක් මත ටෙන්ඩර් කළා. අවුරුද්දක් පාසා අපි මේක ටෙන්ඩර් කළා. ඒකෙදී අවුරුද්දක් ගානේ 10%ක් වැඩි කිරීමක් තමයි කරන්නේ. අපි මේවා දීර්ඝ කාලීනව බදු දෙනවා කියමුකෝ. අපි මේවට අනුමැතිය දෙන්න ඕන ඒවත් තිබෙනවා දෙන්න ඕනේ නැති ඒවත් තිබෙනවා. ළමා උද්‍යානයේ එක්කෝටි ගාණක්. ඒක ඒ මනුස්සයට අවුරුදු 10ක් ගියත් ඒ මුදල හම්බ කර ගන්න බැහැ. අපිට මේක වරකාපොල තිබෙන නිසා වැඩි ගාණකට ටෙන්ඩර් කරන්න පුළුවන්. මේ වාගේ දේවල් දීර්ඝ කාලීන බදු පදනමට යන්න එපා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

ඔබතුමා කියන කාරණය හරි.කඩ කාමරයේ මෙහා පැත්තේ එක දීර්ඝ කාලීනව දීලා තිබෙන්නේ ටෙන්ඩර් දමන්නේ නැතිව. අපි ආවට පස්සේ හදපු එක දීර්ඝ කාලීනව බදු දෙන්න ටෙන්ඩර් දමනවා. ඕන කෙනෙකුට ඕන ගාණකට අරගන්න පුළුවන්. මොකුත් ප්‍රශ්න නැහැනේ එතකොට. ඔබතුමා යෝජනා කරනවා නම් මේ කඩ දෙකම ටෙන්ඩර් දමන්න සුදුසුයි කියලා මම බලලා දෙකම කරන්නම්. ඇත්තටම සල්ලි හොයන්න නේ මේ කරන්නේ.ඉස්සරලා ටෙන්ඩර් දමපු එක නීත්‍යානුකූලව ටෙන්ඩර් කරලද බලලා නීත්‍යානුකූල නොවන

ලෙසට ඒව කරලා තිබෙනවා නම් මහ සභා තීරණයක් ගනිමු නිත්‍යාණුකූලව තක්සේරු කර ටෙන්ඩර් කරන්නට.

<u>ගරු මන්ත්‍රී පී.සරත් කුමාර මැතිතුමා.</u>
විපක්ෂ නායකතුමා අදහස් දැක්වූ කාරණය සාධාරණයි. නමුත් මම කියන්නේ අවුරුද්දෙන් අවුරුද්දට ටෙන්ඩරයට යන්න එපා. ඒ මිනිස්සු බොහොම අමාරුවේ ඒ කඩ කාමර කරන්නේ. ටෙන්ඩරයට ගියොත් ඕක වෙන පුද්ගලයෙක් ඩැහැ ගන්නවා. එතකොට ඒක වැඩි මිලකට අරගෙන දෙනවා. අසරණ වුණ වෙලාවට ඒ මනුස්සයා එතනට එනවා. කරගන්න බැරි වෙලාවට ඒ මනුස්සයා අසරණ කරලා දාලා ටෙන්ඩර් කරන එක වැරදියි. මම විපක්ෂ නායකතුමාට විරුද්ධව නොවෙයි කතා කරන්නේ.එතන ඒ කඩ කාමර දෙක කර ගෙන යන පුද්ගලයෝ දෙන්නයි අනෙක් කඩ කාමර කරගෙන යන පුද්ගලයොයි අතර පරස් පරයක් තිබෙනවා. ඒ නිසා ඒ තැනට යන්න එපා.

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>
වාර්ෂික ටෙන්ඩර් කරන කොට මේ අවුරුද්දේ ගත්ත ටෙන්ඩර් මුදලට 10%ක් එකතු කරලා තමයි අවම ටෙන්ඩර් මුදල බවට පත් වෙන්නේ. එහෙම යන්න පුළුවන්.

<u>ගරු මන්ත්‍රී පී.සරත් කුමාර මැතිතුමා.</u>
ළමා උද්‍යානයත් අපි මේ ක්‍රමයට දුන්නානේ. අපි කියන ඉල්ලීම් වලට ඔවුන් එකඟ වෙලා යනවා. නමුත් අවුරුදු හතරක් පහක් විතර යන විට අවුරුදු 10ට බදු දීලා තිබෙන නිසා නීත්‍යාණුකූලතත්වයෙන් අයින් වෙනවානේ.

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>
නෑ සරත් මන්ත්‍රීතුමා, එයාගේ ආදායමෙන් 35%ක් සභාවට ගන්නවා. 65% එයාලට යනවා. අපි හිතමුකෝ වර්ෂයක් යන විට එයාලගේ ගාස්තු වැඩි කරනවා කියලා. අපේ අනුමැතියෙන් තමයි වැඩි කරන්න ඕනේ.කීයට ටිකට් එක ගියත් 65%ක් ඒ පුද්ගලයාටත් 35%ක් අපටත් එනවා. සම්පූර්ණ ආර්.ඕ අධීක්ෂණයෙන් තමයි කරන්න වෙන්නේ.ලේකම්තුමිය මේ කඩ කාමර ලබා දීමේ නීත්‍යාණුකූල භාවය පිළිබඳව සොයා බලන්න.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 09 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

<u>**ඉ - 10**</u>

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව</u>

නෙළුන්දෙණිය ආයුර්වේද ගොඩනැගිල්ලේ බිම් මහලේ කඩ කාමර දෙක වසර 10 කට දීර්ඝ කාලීනව බදු දීම සඳහා වන තක්සේරු වාර්තාව ලැබී ඇත. ඒ අනුව වරිපනම් අංක 04 දරණ කඩ කාමරය සඳහා මාසික කුලිය රු 9000.00 ක් ලෙසද වරිපනම් අංක 04 ඒ දරණ කඩ කාමරය සඳහා මාසික කුලිය රු.8500.00 ක් ලෙසද තක්සේරු කර ලබා දී ඇති බැවින් මෙම කඩ කාමර දෙක දස අවුරුදු දීර්ඝ කාලීන බදු පදනම යටතේ බදු දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන ප්‍රසම්පාදන ටෙන්ඩර් ක්‍රම වේදය අනුගමනය කර ටෙන්ඩර් කිරීම සුදුසු බව මම මේ ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා.</u>
සභාව සතු කඩ කාමරයක් හෝ දේපළක් දීර්ඝ කාලීන බදු දීමේදී 10% ක වාර්ෂික බදු ප්‍රතිශතයක් ලබා ගන්නා ලෙස සංශෝධනයක් ලෙස ඉදිරිපත් කර සිටිනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

නෙළුන්දෙණිය ආයුර්වේදය තිබුණ ගොඩනැගිල්ල ටෙන්ඩර් කරුවෙක් විසින් ලබා ගෙන ඊළඟ අවුරුද්දේ ටෙන්ඩරය ගත්තේ නැහැ.කුමාර මන්ත්‍රීතුමා, උප සභාපතිතුමා, මම මැදිහත් වෙලා මේ කඩ කාමරය සීල් කළා. ගෙවන්න කියනවා ගෙවන්නේ නැහැ. ඒ නිසා කරන්න දෙයක් නැහැ. අපි කඩයට සීල් තිබ්බා. දැන් අලුතෙන් කඩය හදන්න ක්‍රමයක් නැහැ. පාරේ ඉදන් අඩි 50 සීමාව නැහැ. අවශ්‍ය කරන පර්චස් 7ත් නැහැ. මේකේ ආදායම් ටික වැඩි කර ගන්න විදිහකුත් නැහැ. අර මනුස්සයා ගන්නෙත් නැහැනේ. අවුරුදු 10කට දීර්ඝ කාලීනව බදු දෙනවා. වාර්ෂිකව යම් ප්‍රතිශතයක් වැඩි කරනවා. ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් මේක ටෙන්ඩර් කරලා ආපසු ලබා දෙන්න තමයි තීන්දු කලේ.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමා කිව්වා ඇවිදින මංතීරුව ගත්ත විට ආදායම වැඩිවන විට ඒ ප්‍රතිශතයත් වැඩි වෙනවා කියලා. එක පැත්තකින් අපි සුභ සාධක පැත්තක් බලන විට අපේ දරුවන්ට සෙල්ලම් කරන්න ඒ ස්ථාවරය අපට ලැබෙනවා. පසුගිය කාල සීමාව තුළදී මට මතකයි මේ කඩ කාමරය ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය කරන විට දොරවල් දමලා වෙනස් කරන්න ඕනේ කියන මතය අපි එදා කිව්වේ නැහැ. ගත්තේ කඩයකටනේ එතන තරඟයකුත් තිබුණා. මේ මනුස්සයා දොරවල් ගලවලා වෙනස් කරනවා. සභාවේ තීන්දුවක් ගත්තේ නැහැ. ඒක වෙනස් කරලා හදන්න ඕනේ කියලා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

අපි තීන්දුවක් ගත්තා නේද කුමාර මන්ත්‍රීතුමා.

**<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා.</u>**

අපි තීන්දුවක් ගත්තේ වෙනස් කරන්න. ඒ වෙනස් කරන එක අයිති වෙන්නේ නැහැ, කියලා තමයි ගිවිසුම්ගත වුණේ.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.</u>**

ගිවිසුම්ගත වෙලා තිබෙන්නේ යම් කිසි අවස්ථාවකදි ඒ කඩේ අතහැරලා යනවා නම්, අපි ඒ ගිවිසුම් ගත වූ රාමුව තමයි කරන්නට ඕනේ. නමුත් ගිවිසුමේ එයාට ගලවා ගෙන යන්න කියලත් සඳහන් වෙනවා. අපි ගිවිසුම බැලුවෙත් නැහැ. අපි එහෙම තීන්දුවක් ගත්තා කියලා මෙතුමා කියනවා. දැන් සභාවේ අනුමැතියට දමනවා මේක ගලවා ගෙන යන්නට. මේක පරස්පරයි. එකක් ගිවිසුමට එකඟ වෙනවා අපි. දැන් සභාවට දමනවා මේ ගලවා ගෙන යන්න දෙන්න ඕනේ කියලා. කොයි ආකාරයේ ගිවිසුමක් තිබෙනවාද කියලා ප්‍රශ්නයක්. අපිට ටෙන්ඩර්කරුගේ ක්‍රියා පටිපාටියට අනුව සභාව හසුරවා ගන්න බැහැ. සභාව ගන්න තීන්දු තීරණ තමයි ක්‍රියාත්මක කරන්න ඕනේ. දැන් ටෙන්ඩරයක් දමන විට අම්මත් දමනවා, තාත්තත් දමනවා, පුතත් දමනවා. ඊට පස්සේ කවුරුවත් ගත්තේ නැති නම් ඒක පාර්ෂවිය ටෙන්ඩරයකට යනවා. මම උදාහරණයක් කියන්නේ.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

අපට වරදින තැන ඔතන තමයි පළමු ටෙන්ඩරය ගත්තම පළමු ටෙන්ඩර්කරු ගත්තේ නැති නම් දෙවන ටෙන්ඩර්කරුට දෙන්නේ පළමු ටෙන්ඩර්කරුගේ මුදලට එකඟ වෙනවා නම් පමණයි.

**<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා.</u>**

ගිය වර ඔය සිද්ධියට මම කතා කළා. එතකොට කිව්වා එක බැරි නම් දෙක , දෙක බැරි නම් තුන කියලා ගත්තා. නමුත් පළමුවෙන්ම ගත්ත මුදලට තමා, තුන් වෙනි කෙනා ගන්න ඕනේ. සභාවේ තීන්දුවක් ගත්තා අවම ලංසු මුදලට වඩා වැඩිනම් තුන් වෙනි එකට වුනත් කමක් නැහැ කියලා. මම ඇහුව විට ලේකම් මිස් තමයි මේකේ නීත්‍යානුකූල තත්වය පෙන්වා දුන්නේ. මම නම් පිළිගන්නෙ නැහැ. හිටපු ලේකම් මිස් ඒක හරි කිව්වා. සභාවේ තීන්දුවක් ගත්තා තුන් වන එකට දෙන්න කියලා.

**<u>ගරු මන්ත්‍රී කේ. රංජිත් කුමාර මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, ඒක වසරකට දුන්නා නම් හොඳයි නේද

**<u>ගරු සභාපති එන් සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

ඇයි ඒ.

**<u>ගරු මන්ත්‍රී කේ. රංජිත් කුමාර මැතිතුමා.</u>**
සංවර්ධනය කරන්න ඕනේ වුනොත්

**<u>ගරු සභාපති එන් සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
නෑ ඒවා කරන්න ඕනේ නැහැ. ඒවා වැඩක් නැහැ. මම බලන්නේ ව්‍යාපාරිකයෙකුට ඒක දෙනවා නම් ඒ ව්‍යාපාර අවුරුද්දෙන් අවුරුද්ද ගලවාගෙන යන්න බැහැනේ ඒ මනුස්සයට.ඔයාට මල්ලි අවුරුද්දෙන් ව්‍යාපාර කරගෙන යන්න බැහැනේ. ආණ්ඩුකාරතුමා අනුමැතිය දුන්නොත් මට ඒක කරන්න පුළුවන්.ඔයාලා ආණ්ඩුවක් ගන්න බලාගෙන කතා කරන ඒවා මට අදාල නැහැ.මගේ කාල සීමාවේ මගේ ආදායම් මාර්ග වැඩි කරන්න ඕනේ. ඒවා නීත්‍යානුකුල කරන්න ඕනේ.නීත්‍යානුකූල කිරීම සඳහා අවශ්‍ය වැඩ ටික මම කරනවා.

ගෝෂාකාරී.................................

**<u>ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.</u>**
අපි මේක මගක් දුරට ආවා. ඇවිල්ලා ටෙන්ඩර් කරනවා. පළමුවෙන්ම ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය එන විට කියන්න ඕනේ, විකෘති කරන්න බැහැ, වෙනස් කරන්න බැහැ. මෙන්න මේ ස්ථාවරයෙන් කරන්න ඕනේ කියලා. සභාවේදී ගන්නා තීන්දු එසේම තිබෙන්න ඕනේ කියලා කියන්න ඕනේ. හේතුව බැරි වෙලාවත් එයා දාපු එක ගලවා ගෙන ගියාට පස්සේ නැවත වරක් අපි ඒකට දොරවල් දාන්න ඕනේ. ඒ තිබෙන ස්ථාවරය තියලා යන්න ඕනේ. ගිවිසුම් කොන්දේසි මාලාව ක්‍රියාත්මක කරන්න ඕනේ. සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මාළු කඩයක් එහෙම කරගෙන ගියා මාස ගාණක් ගත්තෙත් නැහැ. ඔබතුමාගේ කට හින්දා ඒක ඉවරයක් කර ගත්තා. සමහර අය ගෙවීම් කරන්නේ නැතුව ඉන්නවා. ටෙන්ඩර් කලායින් පසුව සභාවේ ආර්.ඕ කෙනෙක් ගිහිල්ලා නීතිමය කටයුතු කරගෙන යන්න ඕනේ. ඒක එක පැත්තක්. මං කියන්නේ, අපි මේක කරන කොට නීතිමය රාමුවකට කරන්න ඕනේ අපේ මේ අවසාන කාල සිමාවේදී අපි නිකං නහින්න ඕනේ නැහැනේ.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
ස්තුතිවන්ත වෙනවා විපක්ෂ නායක තුමාට.

**<u>ගරු මන්ත්‍රී ඩී.ජයසිංහ මැතිතුමා.</u>**
සභා වාර්තාවේ තිබෙනවා මේක ගලවාගෙන යන්න කියලා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
කවුද ගලවාගෙන යන්න කියන්නේ. මේකේ මොකුත් නැහැ. මේ යෝජනවට අදාලව කතා කරන්නකෝ.මම කතා කරන්නේ නෙළුන්දෙණිය ආරෝග්‍ය ශාලාව ගැන.
ගෝෂාකාරී......................

**<u>ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා</u>**
ඒ යෝජනාව සංශෝධන වලට යටත්ව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 10 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 11</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**
සභාවට අයත් RV-2780 ට්‍රැක්ටර් ට්‍රේලරයේ හබ් සේසර් අලුත්වැඩියා කිරීමට අවශ්‍යව ඇති බැවින් සේන මෝටර් වර්ක්ස් වෙත යොමු කර එම ආයතනය මඟින් ලබා දුන් ඇස්තමේන්තුව යන්ත්‍රෝපකරණ අධිකාරියේ මෝටර් යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කර නිර්දේශය ලබා ගෙන ඇති බැවින් සේන මෝටර් වර්ක්ස් ආයතනය මඟින් ට්‍රැක්ටර් ට්‍රේලරයේ හබ් සේසර් අලුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**සේන මෝටර් වර්ක්ස්**

| | | |
|---|---|---|
| ට්‍රැක්ටර් ට්‍රේලරයේ දකුණු පස හබ් සේසර් 2 සහ ඔයිල් සීල් ග්‍රීස් කර සපයා සවි කිරීම | | රු. 3500.00 |
| ට්‍රැක්ටර් ට්‍රේලරයේ වම් පස හබ් සේසර් 2 සහ ඔයිල් සීල් ග්‍රීස් කර සපයා සවි කිරීම | | රු. 3500.00 |
| **අමතර කොටස්** | | |
| ලොකු හබ් සේසර් 2 | 8500.00 ×2 = | රු.17000.00 |
| පොඩි හබ් සේසර් 2 | 6500.00 ×2 = | රු.13000.00 |
| සයිනොෆැක් ග්‍රීස් කිලෝ 1 | | රු. 3800.00 |
| ඩීසල් ටැංකි කප් (ට්‍රැක්ටර් සඳහා) | | රු. 1500.00 |
| | | රු.42300.00 |

**ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එස්.ආර්.කේ ලොකුගලප්පත්ති මැතිතුමා.**

මේකේ සේසර් 04ම දාන්න තමයි යෝජනාවේ තිබෙන්නේ සමහරක් විට සේසර් හොඳ වුනොත් අවශ්‍ය ප්‍රමාණය පමණයි දමන්නේ.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 11 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 12**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් සතිපොළ භූමියේ සාදා නිම කර ඇති නව කඩ කාමර 14න් ටෙන්ඩර් කර ලබා දිමට යෝජිත ඉහල මහලේ කඩ කාමර 07 සඳහා නව විදුලි සම්බන්ධතා 07ක් ලබා ගැනීමට යන ඇස්තමේන්තු ගත මුදල රු.43551.28 ×07= රු.304858.96 ක් වේ. (එහි බිල්පත් පියවීම කඩ කාමර හිමියන් විසින් සිදු කරනු ලබයි) නව සම්බන්ධතා ලබා දීමේ වියදම සහා අරමුදලෙන් දැරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 12 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 13**

**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී. මුහන්දිරම් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.ටී.කරුණාදාස ලෙනගල මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා,ගරු මන්ත්‍රී එම්.පී. සමන්මාලා මැතිනිය යන අය විසින් කරනු ලබන යෝජනාව**

2022.11.03 දිනැති මහ සභාවේ තීරණ අංක ඉ-07 යටතේ සභා සම්මත වූ යෝජනාව සඳහා වූ සංශෝධිත යෝජනාව.

මාහේන ආදාහනාගාරයේ 2021.12.31 දින සවි කරන ලද නව විදුලි ජනක යන්ත්‍රයේ මේ දක්වා කිසිදු සේවා පරීක්ෂාවක් සිදු කර නොමැති අතර, ආදාහනාගාර භාරකරු විසින් දන්වා ඇති පරිදි හදිසි අලුත්වැඩියා කටයුත්තක් පැන නැගී ඇති බැවින්, කාර්මික නිළධාරී වාර්තාවටද අනුව එම යන්ත්‍රය මිලදීගත් වින්සි

ඉංජිනියරින් ආයතනය විසින් අප වෙත 2022 වර්ෂයේදී එවන ලද සේවා සැපයුමට අදාලව ගෙවීය යුතු වටිනාකම වන රු.99680.00ක මුදල 2023 වර්ෂයේ ගෙවිය යුතු VAT ප්‍රතිශතය වැඩිවීම හේතුවෙන්,රු.102350.00ක් ලෙස සංශෝධනය විය යුතු බවට අපි මෙම ගරු සභාවට යෝජනා කරමු.

<u>ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 13 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

<u>**ඉ - 14**</u>

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>

2022.12.31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීම සුදුසු බවටත් එහි ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 14 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

<u>**ඉ - 15**</u>

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>

2023 වර්ෂයේ මෙම සභාවට අදාල සැපයුම් සේවාවන් හා කර්මාන්ත සඳහා තත්ත්ව පරීක්ෂාව සිදු කිරිමට අදාල තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා ද්විත්ව සමාජිකත්වය දරණ නිළධාරීන් සංශෝධනය කර පහත සමාජිකයන්ගෙන් සමන්විත කමිටුව පත් කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

- පරිගනක තාක්ෂණික දැනුම ඇති අයෙක් (ගුරුවරයෙක්)
- විදුලි කාර්මික දැනුම ඇති අයෙක් (විදුලි බල මණ්ඩලය)
- වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ( යන්ත්‍රෝපකරණ අධිකාරිය )
- ජල සම්පාදන කටයුතු පිළිබඳ දැනුම ඇති අයෙක් (ජල සම්පාදන මණ්ඩලය)
- ඖෂධ පිළිබඳව දැනුම ඇති අයෙක් (වෛද්‍යා/වරකාපොල ආයුර්වේද රෝහල)
- කාර්මික නිළධාරීවරයෙක් (ඩබ්ලිව්.ඒ.සී.ධර්මරත්න මිය)
- ප්‍රධාන කළමණාකරණ සේවා නිළධාරී

<u>ගරු මන්ත්‍රී එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 15 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**කර්මාන්ත කමිටුවේ ගරු සභාපති එස්.එච්.ඩී.පී. රණතුංග මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

2023.01.17 වන දින පැවති කර්මාන්ත කමිටුවේ කල් දී ඇති යෝජනාව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**01.**නෙළුන්දෙණිය නගරයේ පිහිටා ඇති ප්‍රාදේශීය සභාවට අයත් ආයුර්වේද ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටා ඇති කඩ කාමර අංක 1 හා 2 ගලිගමුව නුවර පාර අංක 77 ලිපිනයේ පදිංචි එස්.ඒ.එච්.ඕ සුබසිංහ යන අයට 2022.06.29 වන දින ටෙන්ඩරයක් මගින් ලබා දී ඇත. එහිදී කාර්මික නිළධාරී උපදෙස් මත අදාළ ගොඩනැගිල්ල අලුත්වැඩියා කර දොරවල් දෙකක් (හැකුළුම් දොරවල්) යෙදීමට අවසර ලබා දී තිබූ අතර ටෙන්ඩරයට අදාළ ගිවිසුමේ 29 වන වගන්තිය අනුව ටෙන්ඩරය අවසන් වූ පසු කාර්මික නිළධාරී උපදෙස් පරිදි ගොඩනැගිල්ලට හානියක් නොවන පරිදි එම දොරවල් දෙක ගලවා ඉවත් කර ගැනීමට ගිවිසුම් ගත වී ඇත.

ඒ අනුව 2022.12.31 දින අදාළ ටෙන්ඩරය අවසන් වී ඇති බැවින් ගිවිසුම් ප්‍රකාරව ටෙන්ඩර්කරු දොරවල් දෙක ගලවා ඉවත් කර ගැනීමට අවසර ඉල්ලා ඇති නිසා කාර්මික නිළධාරී උපදෙස් පරිදි අදාළ දොරවල් දෙක ගලවා ඉවත් කර ගැනීමට සුදුසු බවට කර්මාන්ත කමිටුව නිර්දේශ කරන ලදී.

**ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.**
මේකේ කියන්නේ පළමුව ගිවිසුමකට එළඹෙනවා. මේ ටික හදලා ගලවා ගෙන යනවා කියන එක. මේ නිසා ඉල්ලීමක් කරනවා මේක හදලා ගලවා ගෙන යනවා කියන එක. මම දන්නේ නැහැ. සභාපතිතුමා බලන්න ඒ ගිවිසුම්.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**
මම දන්නේ නැහැ. අපෙන් ඉල්ලීමක් කරලා තිබුණා මේ දොරවල් ඉවත් කරලා අලුත් දොරවල් දමන්නට

**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේ ගිවිසුමේ විදිහට මාස තුනක් අවසානයේදී ඔහු විසින් සවි කරනු ලබන බඩු නැවත ගලවා ගෙන යන්නට අවසර දෙනවා කියන එක තමයි ගිවිසුමේ තිබෙන්නේ. ඒ නිසා මේ යෝජනාව දමන්න උවමනාවක් නැහැ. මේ ගිවිසුමේ විදිහට ගලවා ගෙන යන්නට පුළුවන්. එතන නෙවෙයි ගැටළුව තිබෙන්නේ. සභාවේ තීන්දුවක් ගත්තා. ලෑලි දොරවල් දිරාපත් වී ඇති නිසා කාර්මික නිළධාරී උපදෙස් මත ටෙන්ඩර්කරුට ඒවා සකස්කර ගැනීමට අවසර දෙනවා, ඒවා ඔහු නැවත හිමකම් පාන්නේ නැහැ කියලා ගිවිසුම්ගත වෙන්න කියලා තමයි සභාවේ තීන්දුවක් අරගෙන තිබෙන්නේ. සභා තීන්දුව අරගෙන තිබෙන්නේ 2022.08.04 . ඒ සභා තීන්දුවට වඩා වෙනස් කරලා ගිවිසුම අත්සන් කළා සභාවේ. ගිවිසුමේ විදිහට කරන්න පුළුවන් සභාවේ අවසර ගන්න ඕනේ නැහැ. සභාවේ යෝජනාවට පරස්පර දෙයක් වෙලා තිබෙන්නේ මේකට අධිහාරයක් වුනොත්. එතන තමයි වැරැද්ද තිබෙන්නේ. සභා ගිවිසුමට අනුව මේක දෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී පී.සරත් කුමාර මැතිතුමා.**
සභා තීන්දු වලට ඉහළින් ගිය කවුරු හරි ඉන්නවා.

**ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.**
මේක සභාවේ යම් කිසි කොන්දේසියකට එකඟව තමයි අනුමැතිය දීලා තිබෙන්නේ . මේවා ගලවාගෙන යන්න කියලා කොන්දේසියක් නැහැ. මේක අධිහාරයක් වුන විට සභාපතිතුමා දන්නෙත් නැහැ, මම දන්නෙත් නැහැ,

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

මම දන්නේ නැහැ. ටෙන්ඩර්කරුට කතා කරමු . මහා සභා තීන්දුව තමයි ගිවිසුමට වඩා වැදගත්. මහා සභා තීන්දුවෙන් ගන්නා වූ තීන්දු තමයි ගිවිසුමට ඇතුලත් කරලා ගිවිසුම් ගත විය යුත්තේ. ඒ නිසා අපි ටෙන්ඩර් ගත්ත කෙනාට කතා කරලා එන්න කියලා, මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා, ගිය වියදම අපි දන්නේ නැහැනේ. මම ඒකට මැදිහත් වෙලා මම ඒක විසදලා දමන්නම්.

**ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.**

ඔබතුමාගේ වරදක් නොවෙයි මම මේ කියන්නේ. මම එකක් කියන්නම්කෝ පසු ගිය කාලයේ වාරියගොඩ කඩ ටික ඉදි කරනවා. ඒක ආර්.ඒ.ඩී.එක සතු ඉඩම් කොටසක්. අපේ කොටසකුත් නෙවෙයි. අපි ප්‍රකාශන ඔප්පුවකින් ඉදි කරනවා. ඉදිකරලා අන්තිමට ටෙන්ඩර් දැම්මා. ටෙන්ඩරය දෙමළ පත්තරේ ගියා. එතකොට වෙක් එක ආපසු ආවා.අන්තිම කඩේ ගන්නකොට පත්තර දැන්වීමක් දමලා නීත්‍යානුකූලව ටෙන්ඩර් දැම්මා. හපු ආරච්චි මහත්තයලා ඉන්න කාලේ කරපු දේවල් කියන්න ගියොත් කියන්න වෙලාව මදි. අපි හොඳ විපක්ෂයක් නිසා ජාමේ බේරුනා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

උප සභාපතිතුමා මට උපදෙසක් දෙන්නකෝ. සභා තීන්දුවක් ගන්නවා යම් කිසි දේපලකට දොර ජනෙල් දමන්නට අවසර දෙන්නට. ඒ අනුව ඉදි කිරීම් කරනවා. සභා තීන්දුවක් ගන්නවා ඉදි කරන ලද දේවල් අරගෙන යන්නට බැහැ කියලා. ගිවිසුම්ගත වෙනවා ගලවා ගෙන යන්නට පුළුවන් කියලා. එසේ වුවත් මේවා ගලවා ගෙන ගියේ නැති නම් සභාවට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ නේද. මට මහා සභාව හැටියට කියලා දෙන්නකෝ. මම ස්තූතිවන්ත වෙනවා, මේ මහා සභාවේ කතා කරලා බේරා ගන්න ඉඩ තියපු එක ගැන. ගෞරවණීය මහා සභාව තුළ මේවා කතා කරලා නිවැරදි කර ගන්න  උත්සාහ කිරිම පිළිබඳව මම ස්තූතිවන්ත වෙනවා.දැන් අපි නිවැරදි වෙමු.

**ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මගෙන් ඉල්ලීමක් කරපු නිසා කියන්නේ. මේවා නීත්‍යානුකූල වෙන්න ඕනේ. ගිවිසුම අත්සන් කරන විට සභාපතිතුමත් ලේකම්තුමිය විසින් තමයි ගිවිසුම අත්සන් කරන්නේ. උප සභාපති මන්ත්‍රීවරු මන්ත්‍රීතුමියන්ලා කියලා සභාවේ යෝජනා වලට අත උස්සනවා. සභාව යෝජනාවක් කළා. සභාවේ යෝජනාව ස්ථිර වෙලා තිබෙනවා. නමුත් ගිවිසුම අත්සන් කරන විට සභා යෝජනාව ස්ථිර වූ දෙයට අනුගත වෙලා තමයි ගිවිසුම අත්සන් කරන්නට ඕනේ. සභා තීරණයට අනුගත වෙලා නැත්නම් ඒ අනුගත වි නැත්තේ මොකද හා සභාව ස්ථිර වුන දේට ගිවිසුම් ගත වුනේ නැත්තේ ඇයි යන කාරණය සොයා බැලිය යුතුයි. ගිවිසුමට වෙනත් දෙයක් ඇතුලත් කරලා ඒක ක්‍රියාත්මක කරන්නට බැහැ.ඔබතුමා සභාවේ අපේ තීන්දුව බලලා ඉන්න. සභා තීන්දුවයි ගිවිසුමයි දෙක පරීක්ෂා කරලා ඉන් පසු මෙය නීත්‍යානුකූල කර ගන්නට ඉදිරියට යමු.

**ගරු මන්ත්‍රී ඩී.ටී.කරුණාදාස ලෙනගල මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මං හිතනවා මේ ප්‍රශ්නය ඉතාමත්ම බැරෑරුම් දෙයක්. සමස්ථයක් ලෙස ගත්ත විට යම් ආයතනයක හෝ සභාව ගත්ත යම් තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමේදී ඊට වෙනස්ව ක්‍රියාත්මක කරනවා නම් ඒක සම්පූර්ණයෙන්ම වැරදි වැඩක්. මේ සෑම ගිවිසුමකටම අත්සන් කරනු ලබන්නේ සභාපතිතුමා හා ලේකම්තුමියයි. ඒ දෙදෙනා අත්සන් කළාට මේ වැරැද්ද පිළිබඳව වගකීම සියළු දෙනාටම දරන්නට වෙනවා. අවංකවම මේ මූල්‍යමය කටයුතු වලදී සභාවට ඇතුලත් කරලා සභාවේ වැඩි කැමැත්තට සම්මත වූ විට ඉන් පිටස්තරව සභාපතිතුමාට හෝ නිළධාරීන්ට ක්‍රියා කරන්නට බැහැ. එසේ ක්‍රියා කරනවා නම් ඒ අයට හැකියාව තිබෙන්නේ මාස 06කට පසුව තමයි නැවත ඒ යෝජනාව වෙනස් කරගෙන ඒ ගමන යන්නට පුළුවන් කම ලැබෙන්නේ. උදාහරණයක් ලෙස කියනවා නම්, පෙර සිටිය සභාපතිවරයෙක් අයිති දුරකතනයට අමතරව තවත් දුරකතනයක් මිලදී ගත්තා. රුපියල් 26000.00 අධිභාරය අවුරුදු ගණනාවකට පස්සේ මටත් ආවා. අපි මොකුත්ම දන්නේ නැහැ. නමුත් ඒක සියළු දෙනාටම ආවා. මෙවැනි දෙයකින් තවත් ප්‍රශ්නයක් මතු වෙනවා. මෙවාට ගැටළු ඇති වෙන්නේ කාලක් ගිය විටයි. එදාට ඒවාට විසඳුම් නැති වෙනවා.මේක සංශෝධනය කරන හැටියට ඉල්ලා සිටිනවා. නැතිනම් මේක විශාල ගැටළුකාරී තත්වයකට මුහුණ පාන්න සිද්ධ වෙනවා.සභාවක් තුළ මූල්‍යමය හෝ වෙනත් කාරණා සඳහා කරන යෝජනා වලින් තමයි ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් කම ලැබෙන්නේ. වගකීම සභාපතිතුමා හා ලේකම්තුමිය වෙත තිබුණා වාගේම අනෙත් සියළු දෙනාටමත් මේක බෙදිලා යනවා. මේකේ සම්පූර්ණ වැරුද්ද නිළධාරීන්ගේ මේවා සොයා බලා ඉටු කිරීමේ හැකියාව තිබෙන්නට ඕනේ.

**<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා</u>**

රෝල් ඩෝ එකක් කියන්නේ සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ හතක් හෝ අටක් ඇති. ඒ මනුස්සයා ගෙනත් සවි කළානේ. මේ සභා තීන්දුවේ හැටියට මේක ගෙනියන්න දෙන්නම බැහැ. ගෙන යන්න දුන්නොත් ඒ දොරවල් වල මුදල අපි සියළු දෙනාටම බෙදෙනවා. ඒ මනුස්සයත් මේකට වියදම් කරලා කරපු නිසා, මිනිහා දැනුවත්ව හෝ නොදැනුවත්ම සිදු කළානේ. මොකක් හෝ ක්‍රවේදයක් අපි සකස් කරලා ගෙවා ගන්න හරි ක්‍රමයක් හදා ගන්න බැලුවොත් හොඳයි කියලා මට හිතෙනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.</u>**

රෝල් ඩෝ එක ගහන්න අපි අනුමැතිය දුන්නද නැද්ද කියන එක ප්‍රශ්නයක්. ගිවිසුම් ගත වෙලා තිබෙනවාද මේක ඉවත් කරගෙන යන්න කියන එක තවත් ප්‍රශ්නයක්. අපි ගිවිසුමකට එළඹිලා තිබෙනවාද කියලා බලන්න ඕනේ. බැරිවෙලා වත් එසේ එළඹිලා නෑ කියලා කිව්වොත් අපට සභාවක් හැටියට සියළුම දෙනා එකතු වෙලා මේකේ තීතිමය රාමුවට ඇතුලත් විය යුතුයි.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

මම යෝජනා කරනවා, සභාවෙන් මේ සඳහා කමිටුවක් පත් කරන්නට මෙය පරීක්ෂා කර ගන්නට. ලේකම්තුමිය, විෂය නිළධාරින්, ගරු උප සභාපතිතුමා ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා, ගරු විපක්ෂනායකතුමා එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා, ගරු මන්ත්‍රී එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා, ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා, ගරු මන්ත්‍රී පී.සරත් කුමාර මැතිතුමා යන අයගෙන් සමන්විත කමිටුවක් පත් කර සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා</u>**

ඒ යෝජනාව සංශෝධන වලට යටත්ව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 16 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 17</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව</u>**

2022.12.24 සිට 2023.01.23 දක්වා වූ ආවරණ අනුමැතියට යටත්ව කරන ලද රු. 4,897,505.94 ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 17 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

***(ගරු මන්ත්‍රී එන්.පී. බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා පෙ.ව 11.10ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.)***

**ඉ -18**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

GIS තාක්ෂණයෙන් මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන, ලබා දි ඇති කෙටි කාලය තුළ නිම කල යුතුව ඇත. එය ඉක්මනින් හා සාර්ථකව කර ගැනීමේ අවශ්‍යතාව මත ඔක්තොම්බර් මස සිට බහුකාර්ය සංවර්ධන සහයකයින් ඒ සඳහා යොදවා ගත් අතර ඉදිරියටද යොදවා ගැනීමට අවශ්‍ය වේ. මේ සඳහා සහභාගී වන බහුකාර්යය සංවර්ධන සහයකයින් සඳහා ඔක්තොම්බර් මස සිට කාර්යය අවසන් වන තුරු සංයුක්ත දීමනාව ගෙවීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

අපට මාර්ග ගැසට් කර නොගැනිම නිසා ලොකු ගැටළු වලට මුහුණ දුන්නානේ. මාර්ග සිතියම් කරලා මිනින්දෝරු ප්ලෑන් එකක් ඕනේ අපට මාර්ගයක් ලියාපදිංචි කර ගන්නට. මංජුල මන්ත්‍රීතුමාගේ පලමුරේ පාරක් අපට රුපියල් තිස් දහසක් වියදම් වුනා මැනුම් කටයුතු සඳහා. ඒක අපට ගෙවන්න බැහැ. ගමේ අය හරහා එකතු කරලා මම ඒ වැඩේ කර ගත්තා. අපි GIS තාක්ෂණය පාවිච්චි කරලා සිතියම්ගත කරනවා පාරවල් ඔක්කොම. ඒ ටික ගැසට් කරන්න එතකොට ප්‍රශ්න ඉවරයි අපට. පළාත් සභාවෙන් අපට උදවු කලා. සබරගමුවෙන් අපි තමයි ඉදිරියෙන්ම ඉන්නේ. ස්ථිර සේවකයින්ට සංයුක්ත දීමනාව ගෙවන්න පුළුවන්. සේවකයන් මදි නිසා අපි බහුකාර්යයන් යොදවනවා. සභා අනුමැතියක් ගත්ත විට අපිට ඒ අයට සංයුක්ත දීමනාව ගෙවන්න පුළුවන්. අපේ නිළධාරීන් කුමාර ඉලංගරතන මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේ පාරවල් මනින්න ගියා. මම එතුමට ස්තූතිවන්ත වෙනවා. ඒ දවසම කුමාර මන්ත්‍රීතුමත් මැදිහත් වුනා. එදා තමයි අපි පාරවල් වැඩි ප්‍රමාණයක මැනුම් කටයුතු සිදු කර ගත්තේ. ඒ කාර්යයට මැදිහත් වීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. අනික් මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා මේ සඳහා උදවු කරන්න කියලා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 18 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ -19**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

වරකාපොල සතිපොල, බස්නැවතුම්පොළ හා සාප්පු සංකීර්ණය ඉදිකිරිමට අදාළව සිදු කරන ලද අධිකරණ ක්‍රියා මාර්ග හා අභියාචනා නඩු තීන්දුව සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ 2023.02.02 දිනැති CLG/LG/K/07/02/03/08 අංක දරණ ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරමි.

2022.06.09 දින මහ සභාවේ තීරණ අංක ඉ-06 යටතේ අභියාචනා නඩු තීන්දුව පිළිගැනීමට සභාව තීරණය කර ඇත.

තවද පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියේ අංක 02 යටතේ දක්වා ඇති කරුණු වන සභා තීරණයක් ගෙන එම දේපළ නැවත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරා දී දේපළ නිරවුල් කර දෙන මෙන් හෝ නැවත නිසි පරිදි පවරා ගැනීම සිදු කරන ලෙස ඉල්ලීමක් කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා**

ඉඩමේ නඩුව අපි පරාදයි. ඒ පැරදුනේ එදත් මම සභාවේදී කිව්වා අපේ නීත්‍යානුකූලව කරුණු දැක්වීමේ වරදක්. මම අදත් ඒ කතාව කියනවා. උප සභාපතිතුමා ඉන්න කාලයේ පවරා ගත්ත ඉඩමක්. අපට සත පහක වැඩක් යූ.ඩී එකෙන් කරන්නේ නැහැ. බස් නැවතුම්පලේ කඩ කාමර ටික ඉදි කළා. ඒ කඩ කාමර ටික මම කිව්වා සභාවට දෙන්න කියලා. කඩ කාමර කැඩුන අයට ඒ කඩ කාමර දුන්නට කමක් නැහැ. අපිට ඒ කඩ කාමර ටික දෙන්න ඒ එන මුදල සභාවට ගන්න කියලා මම කිව්වා. යූ.ඩී එක මට ඒක දුන්නේ නැහැ. තව දුරටත් නඩු කිය කියා යූ.ඩී එකට ඉඩම නිරවුල් කරලා දෙන්න මට උවමනාවක් නැහැ. සභාවේ සල්ලි වියදම් කරන එක අපරාදයක්. ලොකු මුදලක් අපි මේකට වියදම් කලා. ඒ නිසා සභාවෙන් ගත්ත තීන්දුව අනුව මම කොමසාරිස්තුමාගෙන් උපදෙස් ඉල්ලුවා.එතුමා අපට ලිපියක් එවලා තිබෙනවා.

සභාපති/ලේකම්.
ප්‍රාදේශීය සභාව ,
වරකාපොල.

**වරකාපොල සතිපොළ, බස් නැවතුම්පොළ හා සාප්පු සංකීර්ණය ඉදි කිරීම.**

උක්ත කරුණට අදාලව ප්‍රධාන ලේකම්ගේ සී.එස්.25(11)/01/(07)2022 හා 2023 01.25 දිනැති ලිපිය හා බැදේ.

02 එමඟින් ,

(අ). උක්ත කරුණට අදාළව වරකාපොල දිසා අධිකරණය ඉදිරියේ පැවති 149/2014 දරන ඉඩම් නඩුව එකී නඩුවේ විත්තිකාර ඔබ ප්‍රාදේශිය සභාවේ වාසියට තීරණය වී ඇතත් එකී නඩුවේ දිසා අධිකරණ තීන්දුවට එරෙහිව අභියාචනයක් සිවිල් අභියාචනා මහාධිකරණය වෙත ගොනු කොට ඇති බවත්, අභියාචනා තීන්දුව මගින් දිසා අධිකරණ තින්දුව දෝෂ සහගත බැවින් පැමිණිලිකාරියගේ වාසියට 2022.04.07 දින අභියාචනා තීන්දුව ලබා දී ඇති බවත්,

(ආ) එකී අභියාචනා තීන්දුවට එරෙහිව නැවත අභියාචනා කිරීමේ කාලය මේ වන විට ඉක්මවා ගොස් ඇති අතර එසේ හෙයින් අභියාචනා අවස්ථාව අහිමි වී ගොස් ඇති බවත්,

(ඇ) එසේම 2022.06.09 වන දින පැවති සභා තීරණ අංක ඉ-06 යටතේ අභියාචනා නඩුවේ තීන්දුව පිළිගැනීමට සභාව තීරණය කර ඇති බවත්,

(ඈ) ඉහත කී තත්වයන් මත උක්ත කාරනය සම්බන්ධව ඔබ ප්‍රාදේශීය සභාව වෙත මෙම ප්‍රශ්නගත දේපල සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේ ඉඩකඩ සීමිත බවත්,

(ඉ) තවද මෙම කරුණට අදාළව දේපල අත්පත් කර ගැනීමේ දී සකස් කරන ලද 4176 හා 1988.12.10 දරණ පිඹුරේ කැබලි අංක 01(පත්තිනි දේවාලය කියන) හා පත්තිනි දේවාලයට අයත් ඉඩම් කොටස තුළ හබ කරන ඉඩම් කොටස පිහිටා ඇති බවත්, එසේම පත්තිනි දේවාලය විසින් අදාල දේපළ භුක්තිකරුවන්ට පවරා දීමක් ද සිදුකොට ඇති බවත්. ඒ අනුව 149/ ඉඩම් නඩුවේ පැමිණිලිකරු එහි පසු අයිතිකරුවෙකු ලෙස උපකල්පනය කල හැකි බවත්,

(ඊ) ඉහත සඳහන් අභියාචනා තීන්දුව මත ඔබ ප්‍රාදේශීය සභාව හබ කරන දේපළ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව අහිමි වී ඇති හෙයින් ද මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් භාරව කටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරිය සහ දේපලේ අයිතිකරුවන දිස්ත්‍රික් ලේකම් සමඟ සාකච්ඡා කොට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම වඩාත් උචිත බවත්,

02. එසේම සභා තීරණයක් ගෙන දේපල නැවත නිසි පරිදි පවරා ගැනීම සිදු කරන මෙන් ඉල්ලීමක් කිරීම වඩාත් සුදුසු බවත්, වශයෙන් පළාත් සභා නීති නිළධාරීගේ නිරික්ෂණද ලැබී ඇති බව කාරුණිකව දැනුවත් කරමි.

එල්.එම්.පී.ඩබ්.බණ්ඩාර,
පළාත් පාලන කොමසාරිස්,
සබරගමුව පළාත.

මම ඉල්ලපු කාරණාවේදී අපට මේ ඇපිල් කරන්න ලක්ෂ විස්සක් විතර යනවා. ලක්ෂ විස්සක් විතර වියදම් කරලා ආපසු අපට මේ ඉඩම යූ.ඩී.එකට දෙන්න වෙනවා. ඒ නිසා මම කිව්වා යූ.ඩී. එක ඉඩම ගන්නවා නම් යූ.ඩී.එක නඩු කියන්න කියලා. අපට දෙන්නේ නැහැනේ ඉඩම. මේක දිස්ත්‍රික් ලේකම් යටතේනේ දමලා තිබෙන්නේ. පළාත් පාලන කොමසාරිස්තුමාට මේ කාරනය සඳහන් කරලා ලිපිය එවලා තිබෙනවා. ඒ අනුව මම කියන්නේ මේක දිස්ත්‍රික් ලේකම්ට කියලා, යූ.ඩී එකට කැමති දෙයක් කර ගන්න කියමු කියලා.පර්චස් 30කින් 1/3 තමයි මේ කියන්නේ. පර්චස් 10ක් මගේ මතකයේ හැටියට. ඒ ටික එයාලට ඕනේ විදිහට කර ගන්න කියමු. ඇපිල් කරන්නත් ලක්ෂ විස්සක් විතර ඕනේ. නඩු ගාස්තු ආයේ ගෙවන්න ඕනේ.ඒ නිසා ඒ අයට ඒක ඕන දෙයක් කර ගන්න කියමු.

<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා.</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා. ඉඩමෙන් 1/3ක් තමයි ඒ අයට තිබෙන්නේ.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 19 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ -20</u>**

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>

සභාවට අයත් 251-1929 කැබ් රථයේ ඇන්ජිම අලුත්වැඩියා කිරීමට අවශ්‍යාව ඇති බැවින් ඒ සඳහා ලැබුණු ඇස්තමේන්තුව යන්ත්‍රෝපකරණ අධිකාරියේ මෝටර් යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කල අතර, අවම මිල ඉදිරිපත් කර ඇති සේන මෝටර් වර්ක්ස් ආයතනය මගින් වසරක හෝ කිලෝ මීටර් 500000 වගකීමක් හා ක්ලච්ප්ලේට් හා ප්‍රෙශර් ප්ලේට් අලුතින් යෙදීමට සිදුවුව හොත් අනෙකුත් ආයතන ලබා දී ඇති ඇස්තමේන්තු ඉක්මවා නොයන පදනම මත අලුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | |
|---|---|
| සේන මෝටර් වර්ක්ස් | රු. 347400.00 |
| සීවලී මෝටර්ස් | රු.448000.00 |
| ජයසිරි ඔටෝ ඉංජිනියරින් | රු.397135.00 |

<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 20 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ -21</u>**

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>

සභාවට අයත් ඩබල් කැබ් රථයේ පූර්ණ සේවාව හා තිරිංග පද්ධතියේ නඩත්තු කටයුතු සිදුකිරීම වෙනුවෙන් සේවා නියෝජිත ආයතනය වන යුනයිටඩ් මෝටර්ස් ලංකා පී.එල්.සී. වෙත රු.137911.08ක මුදල ගෙවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 21 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ -22**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

සභාවට අයත් බොබ් කැට් යන්ත්‍රයේ ජැක්සීල් අලුත්වැඩියා කිරීමට අවශ්‍යාව ඇති බැවින් හසිත මෝටර්ස් ගරාජ් ආයතනය වෙත යොමු කර එම ආයතනය මඟින් ලබා දුන් ඇස්තමේන්තුව යන්ත්‍රෝපකරණ අධිකාරියේ මෝටර් යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කර නිර්දේශය ලැබී ඇති බැවින් ඉහත ආයතනය මඟින් ජැක්සීල් අලුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**හසිත මෝටර් ගරාජ්**

| | |
|---|---|
| ඉදිරි බකට් ජැක් සීල් කිට් | රු.9800.00 |
| මල්ටි බකට් ජැක්සීල් කිට් | රු.8200.00 |
| බකට් සාෆ්ට් පොලිෂ් කිරීම ජැක් නට් පොට සුද්ද කිරීම හා | |
| මල්ටි බකට් සාෆ්ට් පොලිෂ් කිරීම | රු.2800.00 |
| සේවා ගාස්තු | රු.13500.00 |
| | රු.34300.00 |

**ගරු මන්ත්‍රී එස්.ආර්.කේ ලොකුගලප්පත්ති මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 22 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ -23**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

" වරකාපොල සතිපොල භූමිය කඩ කාමර ඉදි කිරීම 6 අදියර " ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සී/ස වරකාපොල විවිධ සේවා සමුපකාර සමිතිය මඟින් 2021.12.20 දින ගිවිසුම් ගත වී ඇත. ගිවිසුම් ගත මුදල රු.1980120.25 කි. ඉන් පසුව 2022.01.24 දින අදාළ ව්‍යාපෘතියෙහි වැඩ කොටසක් නිමවා කොන්ත්‍රාත්කරු විසින් කොටස් ගෙවීමක් ඉල්ලා සිටි අතර 2022.02.21 දින රු.919150.00 ක කොටස් ගෙවීමක් සිදු කර ඇත.

2022.02.24 දින මෙම ව්‍යාපෘතියේ තවත් වැඩ කොටසක් නිමවා ඒ සඳහාද කොටස් ගෙවීමක් ඉල්ලා සිටි අතර 2022.04.05 වන දින රු. 434909.64 ක කොටස් ගෙවීමක් සිදු කර ඇත.

2022.03.20 දින ව්‍යාපෘතියෙහි ගිවිසුම්ගත කාලය අවසන් වන අතර ඒ වන විටත් ඉදි කිරීම් අවසන් කර නොමැති බව අපගේ කාර්මික නිළධාරී විසින් වාර්තා කරන ලදී.

අදාළ කොන්ත්‍රාත්තුවේ වැඩ 60% කට වැඩි ප්‍රමාණයක් සාර්ථකව නිම කර ඇති අතර වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ ගොඩනැගිලි ද්‍රව්‍යවල මිළ ඉහළ යාම නිසා ඉතිරි වැඩ කර ගැනීමට නොහැකි වී ඇති බවත් ගිවිසුම අවලංගු කර දෙන ලෙසත් 2022.12.16 දිනැති ලිපිය මගින් කොන්ත්‍රාත්කරු ඉල්ලීමක් කර ඇත.

ඉහත කරුණු සලකා බලා අදාළ කර්මාන්තයේ ගිවිසුම අවලංගු කිරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 23 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සහා සම්මත විය.***

**<u>ඉ -24</u>**
**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**
දීර්ඝ කාලයක සිට අය නොවන සේවක ණය සම්බන්ධව කෑගල්ල දිස්ත්‍රික් පළාත් පාලන ආයතනවල විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී ගත් තීරණයට අනුව අයකරගත නොහැකි ණය කපා හැරීම සඳහා අනුමැතිය ඉදිරිපත් කරන ලෙස 2022.12.31 දිනැති CLG/LG/102/02/04/31 අංක දරණ පළාත් පාලන කොමසාරිස්තුමාගේ ලිපිය මඟින් දන්වා ඇත.
ඒ අනුව මියගිය පුද්ගලයින්ගේ, පදිංචිය සනාථ කරගත නොහැකි පුද්ගලයින්ගේ හා කිසිසේත් ණය අයකර ගත නොහැකි පුද්ගලයින්ගේ පහත ණය ශේෂයන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් කපා හැරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අංක | නම | විස්තර | මුදල(රු.) |
|---|---|---|---|
| 1 | පී. ලීලාවතී මිය | මියගොස් ඇත | 3582.00 |
| 2 | ජේ.එම්.යූ ඉන්ද්‍රපාල | මියගොස් ඇත | 4200.00 |
| 3 | එම්.පී අජිත් සුසන්ත | මියගොස් ඇත | 8750.00 |
| 4 | එන්.ඩී.එස් ධර්මසිරි | ස්ථාන මාරු වන විට අඩුවෙන් තොරතුරු ලබාදීම මත ණය ශේෂවී ඇත | 1000.00 |
| 5 | ආර්.පී ප්‍රේමරත්න | සේවය හැරගොස් පදිංචිය සනාථ කරගත නොහැකිය | 96555.12 |
| 6 | එච්.ආර් දිසානායක | ස්ථාන මාරුවී ඇති අතර සිහිකැඳවීම් සඳහා ප්‍රතිචාර නොමැත.ඇපකරුවන් හඳුනා ගැනීමටඅදාල ලිපිගොණු නොමැත. (1996 වර්ෂය ණය ගෙන ඇත.) | 1052.00 |
| 7 | ඩී. සෙනෙවිරත්න | සේවය හැරගොස් ඇති අතර සිහිකැඳවීම් සඳහා ප්‍රතිචාර නොමැත.ඇපකරුවන් හඳුනා ගැනීමටඅදාල ලිපිගොණු නොමැත. (1998 වර්ෂය ණය ගෙන ඇත.) | 700.00 |
| 8 | එම්.ආර්.යූ රංජිත් | සේවය හැරගොස් ඇති අතර සිහිකැඳවීම් සඳහා ප්‍රතිචාර නොමැත.ඇපකරුවන් හඳුනා ගැනීමටඅදාල ලිපිගොණු නොමැත. (1999 වර්ෂය ණය ගෙන ඇත.) | 1500.00 |
| | එකතුව | | **117339.12** |

<u>ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා.</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>
අවුරුදු 10ක් රාජ්‍ය සේවයේ හිටපු අය ණයක් ගන්න විය ඇපකරුවන් අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ කියන්නේ එයාලට විශ්‍රාම වැටුපට හිමිකම් කියනවානේ ඒකයි. නමුත් එහෙම හිතනකොට ඒ අය හිතුවේ නැහැ, රැකියාව

දාලා ගියොත් මොකද වෙන්නේ කියලා. නීත්‍යාණුකූලව විශ්‍රාම ගියොත් හරිනේ. අපේ සිං දැන් අතුරුදහන්. මං කිව්වා ලියුම් ගහන්න කියලා. එක, දෙක, තුන ගහලා සේවය හැර යාමේ ලිපිය ගහන්න කියලා. සිං ස්ථිර සේවකයෙක් නේ දැන් එයා සේවය හැර ගිහිල්ලා. දැන් ගත්ත ණය මොකද කරන්නේ.ඉහත නම් ටික කපා හරින්න කියලා ආණ්ඩුකාර අනුමැතියට යවනවා වෙන කරන්න දෙයක් නැහැ.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 24 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ -25**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

75 වන නිදහස් සමරු උළෙලට සමගාමීව වරකාපොල නගරයේ නාගරික වනාන්තරයක් ඉදිකිරිමේ සංකල්පය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය සතුව පවතින වරකාපොල මහජන ක්‍රීඩාංගනයේ හරිත බිම් වගා තීරය තුළ බුරුත, ඇසල, කරඳ වැනි ශාක සිටුවීමට තීරණය කර ඇත. මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, වරකාපොල ප්‍රාදේශීය සභාව හා තරුණ සේවා සභාවේ සහභාගීත්වයෙන් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා වරකාපොල ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රය යොදා ගනිමින් බිම සකස් කර වලවල් කැඩීම සිදු කර වන වගාවේ ඉදිරි නඩත්තු කටයුතු කර ගෙන යාම සඳහා සැකසූ ව්‍යාපෘති යෝජනාව සඳහා සහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

නාගරික සංවර්ධන අධිකාරියට තිබෙන මේ ඉඩම මහාමාර්ග සංවර්ධන අධිකාරියෙන් පාලම් දෙකක් දමලා සකස් කරන්න සැළසුම් කරලා ඒකේ වැඩ කටයුතු ආරම්භ කරනවා. ආනන්ද ස්ටුඩියෝ එක පැත්තෙන් එක පාලමකුයි මෙහා පැත්තේ එක පාලමකුයි දමලා පාලම් දෙකක් දමලා ඉඩම කට්ටි කරන්න පුළුවන් විදිහට මාර්ග සංවර්ධන අධිකාරියෙන් පාරවල් නඩත්තු කරනවා. යූ.ඩී එකෙන් ඒක විකුණනවා. ඊට පස්සේ ගොඩනැගිලි හැදෙන තත්වයට ඒ අය පත් කර ගන්නවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 25 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ -26**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

2022.01.01 දින සිට 2022.12.31 දිනට සකස් කරන ලද මුලා ප්‍රකාශ වාර්තාව (අවසන් ගිණුම) පිළිගැනිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 26 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ -27**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

2023 වර්ෂය සඳහා සභාවට අවශ්‍ය විජී පහන් අලුත්වැඩියා/සවිකිරීමට අවශ්‍ය විදුලි උපාංග මිලදී ගැනීම වෙනුවෙන් දිනමිණ පුවත්පතේ 2022.01.20 දින පළ කල පුවත්පත් දැන්වීම වෙනුවෙන් රු.7,038.00ක මුදල 'ද ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ්' වෙතට ගෙවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 27 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ-28**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

2022.12.31 දිනෙන් අවසන් වන භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව මායින්නොළුව භූමියේ පවතින තාර බැරල් සඳහා තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව ඉදිරි කටයුතු කිරීමට නිර්දේශ කර ඇති බැවින් හා මෙම ආයතනයේ පූර්ව මිශ්‍රණ අංගනය ක්‍රියාත්මක නොවන බැවින් ඒවා තාක්ෂණික වාර්තාවේ නිර්දේශ අනුව විකිණීම හෝ වෙන්දේසි කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 28 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ-29**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

සභාවට අයත් LL-7740 කෘෘ කැබ් රථයේ ක්ලච් පොම්පය අලුතින් සවි කිරීම සඳහා සේවා නියෝජිත ආයතනයේ බලයලත් නියෝජිත ආයතනයක් වන සීවලී මෝටර්ස් ආයතනය මඟින් මිල ගණන් ලැබී ඇත. එම මිල ගණන් මම මෙම ගරු සභාවට ඉදිරිපත් කරන අතර ඉහත අලුත්වැඩියාව සීවලී මෝටර්ස් ලංකා ආයතනය මඟින් සිදු කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**LL-7740 කෘෘ කැබ් රථයේ ක්ලච් පොම්පය අලුතින් සවි කිරීමේ ඇස්තමේන්තුව**

| | |
|---|---|
| 01. ක්ලච් සේව් ගලවා සවි කිරීම අවශ්‍ය උපකරණ | රු.2500.00 |
| 02.ක්ලච් සේව් 1 | රු.35500.00 |
| 03.බ්‍රේක් ඔයිල් 1 | රු. 2000.00 |
| | රු.40,000.00 |

**<u>ගරු උප සභාපති ආර්.ඇම්.ජ්.එන්.රණතුංග මැතිතුමා</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 29 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ-30</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**
දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු විවිධ තනතුරු වලට (රියදුරු, මුරකරු. විදුලි, ජල, කාර්යාල සේවක සේවයේ) යොදවා ඇති බහුකාර්ය සංවර්ධන සහායක සේවක පිරිස සඳහා ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම උදෙසා ආයතනයේ නිළ හැඳුනුම්පත් සකස් කර දීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 30 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ-31</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**
මෙම සභාවට අයත් සුවැති පෙත්මහ ඇවිදින මංතීරුවේ ඇති ළමා උද්‍යානය තුල ව්‍යවසායක දායකත්වයෙන් ක්‍රීඩා උපකරණ ස්ථාපිත කර ඇත. එය කුඩා දරුවන්ගේ අයිතියට පත් කිරීමට කටයුතු සූදානම් ඇත. ඒ සඳහා යම් මුදලක් සභා අරමුදලින් දැරීමට සිදු වුවහොත් එය 2023 අයවැය ලේඛනයේ 607(9)1 පෙරපාසල් යටතේ වියදම් දැරීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 31 යටතේ 2023.02.09 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
මහ සභාව ටෙන්ඩර් මණ්ඩලයක් බවට පත් කිරිමට යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එස්.පි.කුමාර ඉලංගරත්න මැතිතුමා.</u>**
එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>(ඊ) කාරක සභා අවස්ථාව - ටෙන්ඩර් මණ්ඩල වාර්තාව .</u>**

**01.**

**වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් 251-1929 ඩබල් කැබ් රථය සඳහා 215 X 70 X 16 ප්‍රමාණයේ ටයර් 4ක් මිලදී ගැනීම.**

| ආයතනය | ටයර් වර්ගය | මිල |
|---|---|---|
| ආර්.එම්.ජී.ටයර් සර්විස් | NANKANAG<br>WESTLANKE | 43600.00 X 4=174,400.00<br>44400.00 X 4=177,600.00 |
| චමල්කා ටයර් සර්විස් | SONAR | 47700.00 X4=190,800.00 |
| සුමිඩැග් ටයර් කම්පැනි (ප්‍රයි) ලිමිටඩ් | CEAT | 47500.00 X 4=190,000.00 |
| ටයර් කෙයාර් | NANKANAG | 52700.00 X 4=210,800.00 |

ලැබූ මිල ගණන් යටතේ අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ආර්.එම්.ජී.ටයර් සර්විස් වෙතින් NANKANAG වර්ගයේ 215 X 70 X 16 ප්‍රමාණයේ ටයර් 4ක් වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් 251-1929 ඩබල් කැබ් රථය සඳහා මිලදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

02.

**ආයතනයේ ජෙනරේටරය අලුත්වැඩියාව වෙනුවෙන් කොයිල් සෙට් මාරු කිරීම හා රෙගියුලේටරය (AVR) මිලදී ගැනීම.**

| විස්තරය | සමන්ත ඔටෝ ඉලෙක්ට්‍රිකල් | වසන්ත ඉලෙක්ට්‍රිකල් | නිව් රත්න මෝටර්ස් |
|---|---|---|---|
| කොයිල් සෙට් පමණක් මාරුකර අලුත්වැඩියා කිරීම | රු.35,000.00 | රු.40,000.00 | රු.43,000.00 |
| රෙගියුලේටරය (AVR)සඳහා | රු.18,000.00 | රු.19,000.00 | රු.18,500.00 |

ලැබූ මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද **සමන්ත ඔටෝ ඉලෙක්ට්‍රිකල්** වෙතින් ආයතනයේ ජෙනරේටරය අලුත්වැඩියාව වෙනුවෙන් **කොයිල් සෙට් මාරු කිරීම හා රෙගියුලේටරය (AVR)** මිලදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරණ ලදී.

03.

**සභාවට අයත් RV-2780 ට්‍රැක්ටරය හා 67-0127 ට්‍රේලරය අලුත්වැඩියා කිරීම.**

| ආයතනය | මිල ගණන |
|---|---|
| උපාලි මෝටර්ස්, ඩී13/1, මැදගම, අල්ගම | රු.100,000.00 |
| සේන මෝටර්ස් , නුවරපාර නෙළුන්දෙණිය | රු.112,000.00 |
| අමරසිංහ මෝටර්ස්,බඹරගල, මැදගම ,අල්ගම | රු.123,000.00 |

ලැබූ මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ඩී13/1, මැදගම, අල්ගම උපාලි මෝටර්ස්, වෙතින් **සභාවට අයත් RV-2780 ට්‍රැක්ටරය හා 67-0127 ට්‍රේලරය අලුත්වැඩියා** කිරීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

**04.**

**කාර්යාලයේ රථ නැවතුම්පල හා මුරකාමරය සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීම.**

| විස්තරය | කැළණි කේබල් පී.එල්.සි,කැළණිය, ශ්‍රී ලංකා (ඒකක මිල) | සංජය ඉලෙක්ට්‍රිකල් සහ ට්‍රේඩ් සෙන්ටර් ,නො.105,නුවර පාර, වරකාපොල (ඒකක මිල) |
|---|---|---|
| 7085(4mm) වයර් | (1m) 259.39 | (1 CORE 1 Ft) 115.00<br>(2 CORE 1 Ft) 226.00 |
| 40Am ට්‍රිප් ස්විච් | 8,229.56 | 8.200.00 |
| 40Am මේන් ස්විච් | 3,195.65 | 3.000.00 |
| 40Am බ්‍රේකර් | 1,369.57 | 1,350.00 |
| ¾ කන්ඩියුට් බට | | 346.00 |
| ¾ බට ක්ලිප් | | 3.50 |
| අඟල කොන්ක්‍රීට් ඇණ | | 2.00 |
| MCB Box ලොකු | | 1,900.00 |
| ½ වෝල් ප්ලග් | | 2.00 |
| 6 මිලි 1 ½ ස්කුරුප්පු ඇණ | | 4.50 |

ලැබූ මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද **නො.105,නුවර පාර, වරකාපොල, සංජය ඉලෙක්ට්‍රිකල් සහ ට්‍රේඩ් සෙන්ටර්** වෙතින් **කාර්යාලයේ රථ නැවතුම්පල හා මුරකාමරය** සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

05.

**2023 වර්ෂය සඳහා විදුලි භාණ්ඩ මිලදී ගැනීම**

| විස්තරය | කැළණි කේබල් පී.එල්.සි,කැළණිය, ශ්‍රී ලංකා (ඒකක මිල) | සංජය ඉලෙක්ට්‍රිකල් සහ ට්‍රේඩ් සෙන්ටර් ,නො.105,නුවර පාර, වරකාපොල (ඒකක මිල) | ගෝල් ඉලෙක්ට්‍රිකල් ඒජන්සීස් (පුද්) සමාගම, යටිනුවර, වීදිය, මහනුවර. |
|---|---|---|---|
| බල්බ 20W- Orange/Dimo | Kelani -1881.70 | Dimo -3075.00 | Orange-2310.00<br>Green- 2100.00<br>Every Day- 1550.00 |
| සෙරමික් හෝල්ඩර් - 2 pin | - | 290.00 | |
| තම්බලර් ස්විච් | - | 420.00 | |
| වයර් රෝල් (1044/100m) | 5,620.00 | 5600.00 | |
| සෝඩියම් බල්බ් හෝල්ඩර් | - | 800.00 | |
| ලයින් ටැප් | - | 500.00 | |
| චෝක් (250w/Bravo) | - | 5,500.00 | |
| ටේප් රෝල් | 129.91 | 120.00 | |

| | | | |
|---|---|---|---|
| (ඉන්සුලේෂන්) | | | |
| ඉග්නේටර් (250W) | - | 1,450.00 | |

ලැබූ මිල ගණන් අතරින් **යටිනුවර වීදිය, මහනුවර, ගෝල් ඉලෙක්ට්‍රිකල් එජන්සීස් (පුද්) සමාගම,වෙතින් ඉදිරිපත් කරල ලද මිල ගණන සමඟ අප වෙත එවා ඇති ලිපියට අනුව එම මිල ගණන් නිෂ්චිතව ලබා දීමට නොහැකි බව දන්වා ඇති බැවින් එම මිල ගණන් ප්‍රතික්ෂේප කිරිමටත්** බල්බ 20W-Orange/Dimo වර්ගයෙන් පමනක් ඉල්ලා ඇති බැවින් **කැළණි කේබල් පී.එල්.සී වෙතින් ඉදිරිපත් තර ඇත්තේ kelani වර්ගයේ බල්බ නිසාත්, ලැබූ මිල ගණන් වලට අනුව අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද නොං.105,නුවර පාර, වරකාපොල, සංජය ඉලෙක්ට්‍රිකල් සහ ට්‍රේඩ් සෙන්ටර් වෙතින්** 2023 වර්ෂය සඳහා විදුලි භාණ්ඩ මිලදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
ටෙන්ඩර් මණ්ඩලය මහ සභාව බවට පත් කිරිමට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>**
එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
ඒ අනුව ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලැබූ අංක ඊ - 01 සිට ඊ - 05 තෙක් නිර්දේශ මහ සභාව විසින් පිළිගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා</u>**
එම යෝජනාව ස්ථිර කරනවා.

***ඉහත ටෙන්ඩර් මණ්ඩලය ගනු ලබන අංක ඊ-01 සිට ඊ-05 දක්වා නිර්දේශ 2023.02.09 මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.***

**උ-01**

**<u>ඒකාබද්ධ ලැබීම්/ ගෙවීම් සාරාංශය</u>**

**<u>ගරු සභාපති එන්. සරත් සුමනසූරිය මැතිතුමා</u>**
2023 ජනවාරි මස ලැබීම් ගෙවීම් වාර්තාව පිළිගැනීම සුදුසු යැයි යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***(2023 ජනවාරි මස ලැබීම් ගෙවීම් වාර්තාව 2023.02.09 මහා සභාවේ තීරණ අංක උ-01 යටතේ ඒකමතිකව සභා සම්මත විය)***

**<u>වෙනත් කරුණු</u>**

**<u>එ 01-(1)</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා</u>**
අද දින මහා සභාවට නොපැමිණි නිවාඩු ලබා ගැනීමට ඉල්ලා ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම.**

| | |
|---|---|
| ඩබ්.රවිඳු ප්‍රභාත් සිං ජයරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| ජී.චන්ද්‍රසිරි මහින්දරත්න මුණසිංහ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| ආර්.පී.මනෝජ් කුමාර් රාජපක්ෂ මැතිතුමා | ගරු මන්ත්‍රී |

**<u>ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා.</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
අදාළ වෛද්‍ය වාර්තා ලබා ගෙන නිවාඩු අනුමත කරනවා.

***(ඒ අනුව මෙම යෝජනාව තීරණ අංක එ 01-(1) යටතේ 2023.02.09 වන දින පැවති මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.)***

**<u>එ 01-(11)</u>**

**<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ඉනෝක ශ්‍යාමලී සමරවීර මැතිනිය.</u>**

ගරු සභාපතිතුමනි, මාගේ මෑණියන්ගේ අවමංගල්‍ය අවස්ථාවේදී ඔබතුමන් ඇතුළු ගරු මන්ත්‍රි මණ්ඩලයේ සියළු දෙනාම සහභාගී වුණා. ඒ සහභාගී වු සියළු දෙනාටමත්, අවශ්‍ය කටයුතු සොයා බලා සියළුම උදවු උපකාර කළ කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් මේ අවස්ථාවේ මගේ ස්තූතිය පුද කර සිටිනවා.

**<u>එ 01-(111)</u>**
**<u>ගරු සභාපති එන් සරත් සුමනසූරිය මැතිතුමා</u>**
ගරු මන්ත්‍රිවරුනි, මට කියන්නකෝ මේ වර්ෂය සඳහා අපි විදුලි පහන් කීයක් ගන්නවද කියලා

**<u>ගරු මන්ත්‍රි එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා.</u>**
ගරු සභාපතිතුමනි, අපි මේ වර්ෂයට විදුලි පහන් 2000ක් ගනිමු.

**<u>එ 01-(1V)</u>**

**<u>ගරු සභාපති එන් සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
මේ වන විට අපි මැතිවරණ කාල සීමාවක තමයි ඉන්නේ.මැතිවරණය පවත්වයිද නැද්ද කියලා අපි දන්නේ නැහැ. මම දන්න එකක් කියන්නද. ස්ථිරවම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රිධූර ලබා ගෙන සජබයට නාම යෝජනා අත්සන් කරපු මන්ත්‍රිවරුන්ගේ මන්ත්‍රිධූර අහෝසි වෙනවා. ඒක මම දන්න එකක්. මම තරම් තමුන්නාන්සේලා මේ සභාවේ ඉන්නවට කැමති මිනිහෙක්, විශේෂයෙන් තමුන්නාන්සේ මේ සභාවේ ඉන්නවට කැමති සභාපතිවරයෙක් නැහැ. විජේතුංග සභාපතිතුමා ඉන්න කාලයෙත් ඔබතුමා සභාවේ ඉන්නවට ඉතාමත්ම කැමති වුනා විජේතුංග සභාපතිතුමා. මමත් ඉතාමත්ම කැමතියි ජයසිංහ මන්ත්‍රීතුමා ඉන්නවට. අපට උදවු කරනවා. හොඳ වැඩ වලට උදවු කරනවා. නමුත් මට දුක දේශපාලන අවශ්‍යතා වලට මේ වගේ නැගී එන දේශපාලන නායකයෝ නැති කම නිසා තමයි මේ ආසනයට වැරදුනේ. රංජිත් මන්ත්‍රිතුමා වගේ කැපකිරීම් කරන නායකයෝ මේ සභාවේ ඉන්න ඕනේ. මම ඔබතුමාගේ දේශපාලන මතය පරාද කරන්නට කතා කරනවා. ඔබතුමා කියන දෙයට විරුද්ධව මම කතා කරනවා. මම සභාපතිනේ. මම ඔබව පාලනය කර ගන්න ඕනේනේ. මන්ත්‍රිවරු 42ක් පාලනය කර ගත්තේ නැති නම් මට මේ සභාව අවුරුදු 5ක් කර ගෙන යන්න බැහැනේ. ඒ නිසා මගේ බලය පාවිච්චි කරලා මම ඒක කරනවා. එහෙම කරත් මම පක්ෂ විපක්ෂයක් නැතිව මම කියන්නේ අපට නායකයෝ ඕනේ. ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන නායකයෝ ඕනේ. මේ ක්‍රමය තුළ මේ වගේ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරපු නායකයෝ ඉවත් වීම තුළ ඇති වෙන්නේ ප්‍රජාතන්ත්‍ර

විරෝධී මිනිස්සුන්ගේ නායකත්වය ගොඩ නැගීම. පසුගිය කාලේ අරගලයට මුවා වෙලා පෙරටුගාමී පක්ෂයත් ජනතා විමුක්ති පෙරමුණත් කරන්න හදපු විනාශය නැවතුනේ තමුනනාන්සේලා වාගේ ප්‍රජාතන්ත්‍රය අගය කරපු මිනිස්සු නිසා. ඒක පැහැදිලිවම කියන්න ඕනේ. තමුන්නාන්සේලාට බලයක් නැති වුණාම, තමුන්නාන්සේලාට කතා කරන්න බැහැ. ඒක නිසා වෙනත් දේශපාලන නායකයෝ තමන්ගේ දේශපාලන අභිමතාර්ථයන් ඉෂ්ඨ කර ගන්නට තමුන්නාන්සේලාට නීතිමය උපදෙස් දෙන්නේ නැතුව තමුන්නාන්සේලාට නාම යෝජනා අත්සන් කිරීම පිළිබඳව තමුන්නාන්සේලාගේ නායකත්වය පිළිබඳව මට පුංචි කණගාටුවක් තිබෙනවා. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් වෙලා තමයි ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට ගිහිල්ලා නාම යෝජනා අත්සන් කළේ. නමුත් තමුන්නාන්සේලා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු වෙලා ඉදගෙන ඉන්න ගමන් වෙනත් දේශපාලන පක්ෂයක නාම යෝජනා අත්සන් කරපු විට ඒ දිවුරුම් ප්‍රකාශය ප්‍රමාණවත් වෙනවා මන්ත්‍රිධුර අහෝසි කරන්නට .මම කියන්නේ කොහෙන තමුන්නාන්සේලා නාම යෝජනා අත්සන් කරත් ඊළග සැසි වාරයේ තමුන්නාන්සේලා මේ සභාව නියෝජනය කරන්න ඕනේ කියන එකයි මගේ ප්‍රාර්ථනය. මම ඇත්තටම සුභ පතනවා. අපි දන්නේ නැහැ හෙට අධිකරණ තීන්දුව මොකක් වෙයිද කියලා. අධිකරණ තීන්දුවට යටත්ව අපි දේශපාලනය කරන්න ඕනේ. නමුත් අපි දේශපාලන වැඩ පටන් ගත්තා. ඒ නිසා කවුරු බලයට ආවත් මගේ මතය තමයි ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න නම් නිසි කලට මැතිවරණ තියන්නට ඕනේ. ඒක මගේ පෞද්ගලික මතය. නමුත් රටේ තිබෙන ආර්ථික තත්වයත් එක්ක රටේ මැතිවරණයක් සඳහා සල්ලි නැති නම්, රටේ ආර්ථිකය කඩා ගෙන වැටෙනවා නම්, මේ විනාශ වෙච්ච තැනින් ආයෙත් ගොඩ ගත්තා නම් කාටවත් මැතිවරණ අවශ්‍ය නැහැ. ජනතා විමුක්ති පෙරමුණට තමයි මැතිවරණය ඕනේ. ඒ අය බලහත් කාරයෙන් මේ මැතිවරණය ඉල්ලන්නේ. ඒක ප්‍රශ්නයක් නෙවෙයි. මම කියන්නේ මේ ඉන්න මන්ත්‍රිවරුන් සියළු දෙනාම ඊළඟ පළාත් පාලන මැතිවරණයෙන් තේරීලා පත් වෙලා එන්නට ඕනේ. මේ ඉන්න අයගෙන් මේ සභාවට සභාපතිවරයෙක් පත් වෙන්නට ඕනේ. මේ ඉන්න අයගෙන් උප සභාපතිවරයා පත් වෙන්නට ඕනේ. මේ සියළු දෙනාම මේ සභාව නියෝජනය කරන්න ඕනේ කියන මතයෙ මම ඉන්නේ.

අද දවසේදී සභා වාරය සාර්ථක කර ගන්නට පැමිණි ගරු උප සභාපතිතුමා , විපක්ෂනායකතුමා, ඒ වාගේම ජොෂ්ඨ මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සියළු දෙනාටමත්, ලේකම්තුමිය, විෂය භාර නිළධාරීතුමිය, මාධ්‍යවේදීන් ඇතුලු සියලු දෙනාටමත් මම ස්තුතිවන්ත වෙනවා. අපි හෙට දවස තුළ බලමු මොකක්ද වෙන්නේ කියලා. මැතිවරණය තිබෙයිද නැද්ද කියලා ඒ අනුව ඉදිරි දේශපාලන ගමන සංවිධානය කර ගනිමු. මට තමුන්නාන්සේලා වෙනුවෙන් කරන්න තිබෙන සමහර කාරනා සීමා වෙලා තිබෙනවා. මැතිවරණ කොමිෂන් සභාවෙන් ලේකම්තුමියට දිගන් දිගටම බලපෑම් කරනවා. ලේකම්තුමියත් ආරක්ෂා කර ගන්න ඕනෙනේ. නිළධාරී රකින්නත් ඕනේ. අපි දේශපාලනය කරන්නත් ඕනේ. සභාව පවත්වාගෙන යන්නත් ඕනේ. මම සංයමයෙන් කටයුතු කරනවා. තීන්දු වලදි ගරු මන්ත්‍රිතුමන්ලා තුමියන්ලා යම් අපහසුතාවයකට පත් වුවොත් මම කණගාටු වෙනවා. මැතිවරණයක් ක්‍රියාත්මක වෙන වෙලාවේ ඉතාමත්ම සංයමයෙන් ඉවසීමෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් සියලු දෙනාටම සුභ පතමින් මම නිහඩ වෙනවා බොහොම ස්තුතියි.......................

| | |
|---|---|
| සභාපති, | ලේකම්, |
| වරකාපොල ප්‍රාදේශීය සභාව, | වරකාපොල ප්‍රාදේශීය සභාව, |